# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්   www.budusarana.lk   email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ වෙසක් අමාවක පෝ දා, 2021 ජුනි 09 බදාදා BUDUSARANA WEDNESDAY JUNE 09, 2021

55 කාණ්ඩය, 50 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 12



# මව්පියන් දරුවන්ට දායාද කරන්නේ හොඳම දෙය ද ?



**මව්පියන්ට මේ ලෝකයෙහි ඇති වටිනාම සම්පත දරුවන් ය. බුදුරදුන් එය දැක්වූයේ "පුත්තා වත්ථු මනුස්සානං" යනුවෙනි. දරුවන් නැණවතුන් කරනවා සේ ම ගුණවතුන් කිරීම අවශ්‍යය. එසේ නොමැති වූ විට දරුවන් නිසා මව්පියන්ට අනන්තවත් පසුතැවීමට සිදුවීම ස්වභාවික ය.**

තමන් සමාජගත කරන දරුවන් මේ ජීවිතය තුළ අතිජාත හො අනුජාත දරුවන්වීම සැම අම්මාකෙනෙක්ගෙම ප්‍රාර්ථනාවයි.

මෙහි දී දරුවා අවජාත දරුවෙක් එනම් ගුණයහපත් කම් අතින් දෙමාපියන්ට වඩා පහත් දරුවකු වෙනවාට මව්පියන් අකමැතිවේ. මෙහි දී මව්පියන්ට ලොකු වගකීමක් පැවරේ. දරුවා කුස පිළිසිඳගත් මොහොතේ සිට දෙමාපියන් කටයුතු කරන අයුරු ඇතැම් දෙමාපියන් මව්පියන් නොදනී. දරු පිළිසිඳ ගැනීමේ දී මෙන් ම කුස මෝරන කාලයේ දී දෙදෙනා සීලයෙහි පිහිටිය යුතු ය. අතීත ඇතැම් මව්වරු තමන් පළමුව පන්සිල් සමාදන් ව නැවත පන්සිල් ඉල්ලා සිටී. නැවත ඔවුන් පන්සිල් ඉල්ලා සිටින්නේ තම කුසහෝනා දරුවාට ය. මහාමායාව පිළිසිඳ ගැනීමේ සිට පෙහෙවස් සමාදන්වූවා ය. අච්චරියධම්ම සූත්‍රයේ දී දක්වනු ලබන්නේ කුස පිළිසිඳගත් දා පටන් මව්පිය එක්වීමක් හෝ සිදු නොවන බවයි. බිරිඳට බිළිඳට සුදුසු නුසුදුසු දෑ පිළිබඳව සැමියා දැනුවත්වීම අවශ්‍යය. දකින සහ අසන දේ සෞම්‍ය විය යුතුය. දෙදෙනා ආරවුල් ඇති කර නොගත යුතු ය. කුස සිටි කාලයේ දී දරුවා මුහුණ දුන් කාරණා ඉපදීමෙන් පසුව කිව නොහැකි වුව ද ඒ අත්දැකීම් දරුවා තුළ ගැබ්ව පවතී.

දරුවන් හා මව්පියන් අතර සම්බන්ධතාව වැඩෙන ප්‍රධාන අවස්ථාව තම නිවසේ දී සිදු කරන බුද්ධ වන්දනා අවස්ථාවයි. බොහෝ මව්පියන්ට මේ මාහැඟි අවස්ථාව මඟහැරියැම කනගාටුවට කරුණකි. එමෙන් ම රාත්‍රී කෑම ටික හෝ එක මේසයක වාඩි වී අනුභව කරනවා යන සිහියෙන් කළ යුතු ය. කෑම කන අවස්ථාවේ දී හෝ දරුවන් මව්පියන් මුණගැසීම අවශ්‍ය ය.

වර්තමාන ලෝකයේ මව්පියන් කාර්යබහුලත්වය මත දරුවන් හා මව්පියන් අතර දුරස්තබාව වර්ධනය වී ඇත. සියල්ල දරුවන් වෙනුවෙන් යැයි පවසා දෙමාපියන් කාර්යබහුල වී ආපස්සට හැරී බලනවිට දරුවන් අහිමිවීයාම සහ මඟහැරීයාම කනගාටුවට කරුණකි.

අනවශ්‍ය තරගකාරීත්වයෙන් මිදී මැදුම් පිළිවෙතේ කටයුතු කිරීම මත මේ තත්ත්වය මගහරවා ගත හැකි ය. දරුවන්ගේ පූර්ව ආචාර්යවරු දෙමාපියන් ය. එහෙයින් ඔවුන් සැකසීමේ ලොකු කාර්යභාරයක් දෙමාපියන් සතු ය. සබ්‍රහ්ම සූත්‍රයේ දී දෙමාපිය කාර්ය මෙසේ දැක්වූහ. ආපාදකා, පෝසකා, ඉමස්ස ලෝකස්ස දස්සෙතාරෝ යනුවෙනි.

ලෝකය දැක්වීම, නිවැරැදි පෝෂණය, මෙහි දී ජානවිකෘති ආහාර, ක්ෂණික ආහාර ඉවත්කිරීම වැදගත් ය. ලෝකයා හමුවේ මෙහෙයවීම අවශ්‍ය ය. දරුවන්ට විවිධ නම් වලින් කතා කිරීම වරදක් නොවුණ ද දුව පුතා යනුවෙන් ඇමතීමට අමතක නොකළ යුතු ය. එසේ නොවුනහොත් එම දරුවන් උස්මහත්ව මව්පියන්ට ඔයා මෙයා ලෙස ආමන්ත්‍රණය කිරීම සිදුවීම සාමාන්‍ය වේ.

අම්මාගේ කාර්යභාරය කොටස් හතරකින් දැක්වේ. එනම් සුහදා, ජනෙන්ති, තෝසෙන්ති, පෝසෙන්ති. අම්මා යනු දරුවාට සුහදත්වය පාන, හොඳ උපතක් ලබාදී පෝෂණය කොට සතුටු කරන තැනැත්තියයි. ඇතැම් විට වර්තමාන ඇතැම් මව්වරුන්ට මේ යුතුකම අමතක ව ගොස් ඇත. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන්ගෙන් දරුවන්ට සිදුවිය යුතු යුතුකම් 05 කි. එනම් පව්වු ක්‍රියාවන්ගෙන් වළක්වා ගැනීම, යහපතෙහි යෙදවීම, ශිල්ප ශාස්ත්‍රය ලබාදීම, නිසි කල ආවාහ විවාහ කරදීම, දායාද පවරාදීමයි. එවිට මව්පිය දූ දරු සබඳතාව ශක්තිමත් වේ.

බෞද්ධ සමාජයට තම දරුවන් මනාව සැකසීම උදෙසා ඉහත දැක්වූ කාරණා සියල්ල යොදාගත හැකි ය.

ධෛර්යයෙන් යුක්තව තම ජීවිත නිවැරදිව මෙහෙයවන පිරිස් සසර තනි නොවේ. සම්මුතික ලෝකය තුළ සමාජ සම්බන්ධතා බැහැර කළ නොහැකි ය. එය වඩා හොඳින් දැනෙනුයේ ලෙඩක් දුකක් හැදී අප අසරණ වූ විටය. කඟවේනකුට, උකුස්සකුට තනිව සිටි හැකි මුත් මිනිසාට එසේ සිටිය හැකි නොවේ. මානව සබඳතා අතින් ගත් විට පෙරදිග ඉතා විශේෂිත ය. දහමට අනුව ගත්විට බ්‍රහ්මදණ්ඩය බරපතළ දඬුවමක් වන්නේ කිසිවකු ඒ භික්ෂුව සමඟ කතා නොකරන නිසාවෙනි.

ඡන්න හිමියන්ගේ මානය පහව උන්වහන්සේ ආධ්‍යාත්මික ශක්තිය සකසා ගැනීමට කටයුතු කළේ මේ දඬුවම නිසාවෙනි.

පත්තනික්කුජ්ජන කර්මය ගිහියා උදෙසා සිදුකරන කර්මයකි. ගිහියන් කාරණා 8ක් පදනම් කරගනිමින් භික්ෂුවට චෝදනා කිරීම එසේ පැනවීමට හේතු වූහ. මෙය ප්‍රථම වරට පැනවූයේ වඩ්ඪලිච්ඡවී කුමරුට ය. මේ බව ආනන්ද හිමියන් සැලකළ පසු ඔහු ක්ලාන්ත වූ බව සඳහන් වේ.

එය දරුවන් අතින් දෙමාපියන්ට සිදුවූව ද සමාජයේ කවර කණ්ඩායමකට සිදු වූව ද, ඔවුහු එයට අකමැති වෙති.

යතාර්ථය ගෙන බැලුවහොත් අප සියලු දෙනා ම සසර තනි වූ පිරිස් ය. එය මෙවැනි කාලසීමාවක දී වඩා වැඩියෙන් හඳුනාගත හැකි වේ. කෙනෙකුගේ රෝගී තත්ත්වයක දී සහ මරණයක දී එය වැඩි වශයෙන් දැනේ. එහෙයින් ධර්මයෙහි පිහිට සහ සදාචාරාත්මක ජීවිතයක් තුළින් සකසා ගන්නා ආධ්‍යාත්මික ශක්තිය මෙහි දී යොදාගත හැකි වේ. ඒ තුළ පාලුව කාංසිය ඉච්ඡාභංගත්වයත් ජීවිතයෙන් දුරු කරගත හැකිවේ. එසේ නොමැතිව පාළුව, තනිකම, හුදකලා බව නැති කර ගැනීමට යැයි සිතා මත්වතුරට ඇබ්බැහිවීම අනුචිත ය.

යම් විටෙක යමෙක් ඔබව ප්‍රතික්ෂේප කරන විට ඔබ මත් වතුරට සමීප වුවහොත් සමාජය තව තවත් ඔබ ප්‍රතික්ෂේප කරනු ඇත. එනම් ආර්ථික ප්‍රශ්න සෞඛ්‍ය ප්‍රශ්න වගේ ම හුදකලා බව තව තවත් වැඩි වේ.

විතක්ක සණ්ඨාන සූත්‍රය තුළ දී මේ කාරණා තේරුම් ගත හැකි සිත්ගන්නා උපමා කිහිපයක් දැක්වේ.

සිරුර සැරසීමට කැමති තරුණ ස්ත්‍රියක් හෝ පුරුෂයකු තම බෙල්ලේ එල්ලන ලද සර්ප කුණක්, බලුකුණක්, මිනිස් කුණක් දැක ලජ්ජාවට පත්වී එය ඉවත් කරන්නා සේ අකුසල සිතිවිලිවල ආදීනව මෙනෙහි කොට එය සිතෙන් ඉවත් කළ යුතු ය.

කිසිම කාරණයක් අමුතු ලෙස නොසිතිය යුතු වේ. එවිට මනස උමතුවෙයි. උමතු මනස දෙලොව ඇවැඩ සිදු කරයි. අල්ලා ගන්නා හැම දෙයක් ම යම් දවසක අත්හැරීමට සිදුවන බව තේරුම්ගෙන කටයුතු කිරීම ඉතා වැදගත් වේ. එය එසේ වුව ද දෙලොව යහපත සැලසෙන සබඳතා රැක ගනිමින් ප්‍රඥාවෙන් කටයුතු සම්පාදනය කර ගැනීමට සැවොම වීර්යය වැඩිය යුතු ය.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# දිවි මඟ සරු කරන ධර්මානුධර්ම ප්‍රතිපත්ති

වෙසක් අමාවක පෝද

## දම් දෙසුම



කොළඹ දිසාවේ සංඝනායක,
ගොතටුව පාරමිතා ශ්‍රී මහ බෝධිමලු විහාරාධිපති , ශාස්ත්‍රපති පණ්ඩිත
**අරම ශ්‍රී ධම්මතිලක නාහිමි**

**සාමාන්‍ය මිනිසකුට ඇතිවන්නේ කරුණාව හා ප්‍රඥවයි. එහෙත් බුදුවරයකුට ඇතිවන්නේ මහා කරුණාව හා මහා ප්‍රඥවයි. මහා ප්‍රඥව හා මහා කරුණාව අනුසාරයෙන් සියලු සත්ත්වයා දුකෙන් මුදවා ගන්නට දිවා රෑ නොතකා, අව්ව වැස්ස නොබලා, වේලාව අවේලාව නොසිතා සියලු සත්ත්වයා දුකෙන් මුදවා ගන්නට කටයුතු කිරීම බුදුවරයකුගේ මූලික අභිප්‍රායයි.**

බුදු සමයේ මූලික හරය රැඳී ඇත්තේ චතුරාර්ය සත්‍ය හා ආර්ය අෂ්ටාංගික මාර්ගය මත ය. සියලුම සත්ත්වයා දුකෙන් වෙළී පැටලී ඇත. එයයි ප්‍රථමයෙන් ම හඳුන්වා දෙන ලද්දේ දුක, දුක ඇතිවීම, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය වශයෙන් මේ චතුරාර්ය සත්‍යය පිළිබඳව යථාවබෝධයක් පුද්ගලයාට නියත වශයෙන්ම තිබිය යුතු ය.

පුද්ගලයා නිවැරදි මාර්ගයකට යා යුතු නම් 'මැදුම් පිළිවෙතට' නැඹුරු විය යුතු ය. කාමසුඛල්ලිකානු යෝගය හෙවත් සිරුරට වඩාත් සැපදීම හා අත්තකිලමතානුයෝගය හෙවත් සිරුරට වඩාත් දුක් දීම බැහැර කොට මේ අන්ත දෙකට ම නැති මැදුම් පිළිවෙත උපයෝගී කොට ගත යුතු ය.

සසරින් එතෙර කිරීමයි බුද්ධ ආඥව වන්නේ. අනවරාග්‍ර හෙවත් කෙළවරක් නැති භවයෙන් මුදවා ගැනීමයි මූලික අභිප්‍රාය. කෙළවරක් නැති භවයේ දිගටම රැඳී සිටිනවාද එසේ නැත්නම් එයින් මිදෙනවාද යන්න ගැනත් සිතා බැලිය යුතු ය. කෙළවරක් නැති භවයෙන් මිදෙන්නේ කෙසේද?

භවය දිග්ගැස්සෙන්නේ පුද්ගලයා කෙරෙහි පවත්නා, ආශාව, ඇල්ම, තෘෂ්ණාව හේතුකොටගෙන ය. පුද්ගලයා යමක් ඇලී ගැලී සිටීමයි අරමුණ. මේ නියතයෙන් අනිවාර්යයෙන් ම නිරන්තරයෙන් ම දුරස්ත විය යුතු ය. ආශාව පොදි බැඳගෙන යා යුතු ගමන දුරු කළ යුතු ය, යන්න බුද්ධ දේශනාවයි.

### ගැල කරට ගන්නවාද? සෙවණැල්ල තෝරා ගන්නවාද?

තෘෂ්ණාව තුනී කිරීමට උපමා කොට ඇත්තේ තමන් පසුපස එන සෙවණැල්ලට ය. දිවියට කිසිදු බරක් නොදැන යන ගමනක සරල සැහැල්ලු සංකේතය තමයි සෙවණැල්ල.. එමෙන්ම බර දරාගෙන යන ජීවන ගමන සම කරන්නේ ගැලට ය. ගොනා පසු පස යන ගැල වූ කලි අතිශය බරකි. එම බරෙන් නිදහස් වන්නේ කවද දැයි ගොනා සිතයි. එහෙත් ඒ සිතිවිල්ලේ පරිසමාප්තියක් නොමැත.

පුද්ගලයා තේරුම් ගත යුත්තේ ගොනා පසු පස යන ගැල කරට ගත යුතු ද? එසේ නැත්නම් තමන් පසු පස යන සෙවණැල්ල තෝරා බේරා ගත යුත්තේ ද යන්නයි. මෙයට අතිශයින්ම බලපාන්නේ ප්‍රඥවයි.

### හොඳ ඉතිරි කරන්න

බුදුසමයේ උගන්වන්නේ අනාත්මවාදි ස්වරූපයයි. පුද්ගලයා 'නිවනට' යන තෙක් භව කතරේ සැරිසරයි. නිවනට සේන්දු වූ පුද්ගලයාට යළි ඉපදීමක් නොමැත. මේ දුක්ඛාවලියෙන් ගැලවුණු පුද්ගලයා පත් වන්නේ නිවනට ය.

පුද්ගලයා හඹා යන්නේ 'හොඳ' හා 'නරක' පසුපස ය. නරක ඉවත්කොට හොඳ පමණක් දිවියට විෂය කරගත යුතු ය. මනුෂ්‍යාත්මයක් ලත් පුද්ගලයා ඒ කාල පරාසයේ දී යහතින් හොඳින් දිවි ගෙව්වා නම් ඊළඟ භවය ගැන අපට ගැටලුවක්, ප්‍රශ්නයක්, අර්බුදයක් ඇතිවන්නේ නැත. මන්ද යත් ඊළඟ භවය පෙර භවයට වඩා ප්‍රසාර්ථ ලක්ෂණවලින් උපයුක්ත බැවිනි.

මෙතැනදී පුද්ගලයා ආත්මාර්ථකාමී හැඟීම්වලින් බැහැර ව පරාර්ථකාමී තලයකට ප්‍රවේශ විය යුතු ය. තමන් ගැන නොව අන් අය ගැනත් සෙවීම ප්‍රඥවන්ත පුද්ගලයාගේ කාර්ය භාරයයි. බුද්ධ දේශනාවේ මෙය මුලට එයි. බුදුරදුන් ගේ කාර්යයත් එයයි. තමන්ගේ ආහාර ගැන නොසිතා යම් පුද්ගලයකු සසරින් මුදවා ගන්නට හැකියාවක් ඇත්නම් ඒ සියල්ල බැහැරකොට ගව් ගණනක් දුර ගෙවා සසරින් ගලවා ගන්නට මහත් වෙහෙසක් ගන්නා ලදී.

### අවරට යන ගමන

ප්‍රඥවන්ත පුද්ගලයා ද ඒ කාර්යයේ නියැළී සිටිය යුතු ය. මෝහයෙන් පිරි පුද්ගලයා ඒ මඟින් බැහැර කළ යුතු ය. පුද්ගලයා අවරට යන්නේ මෝහය මත ය. මෝහය හෙවත් මෝඩකමෙන් ගලවාගෙන ප්‍රඥවන්ත මාවතට නැඹුරු කිරීම පරාර්ථකාමී පුද්ගලයාගේ කාර්ය භාරයයි. බුදුරදුන් පන්සාළිස් වසරක් පුරා සිදු කෙළෙත් මෙයම ය.

මෙතනදී වැදගත් වන්නේ 'ප්‍රතිපත්තියයි' ප්‍රතිපත්ති පිරීම මතයි දිවි මඟ සරු කෙතකට ප්‍රවේශ වන්නේ .

ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාවයි පුද්ගලයාට අවශ්‍ය වන්නේ . පිළිවෙත් පුරන්නේ නැත්නම් කොතරම් ආමිස පූජා වින්ඳත් එයින් කිසිදු ඵලක් නොමැත.

බාහිර හා අභ්‍යන්තර වශයෙන් පුද්ගලයා ප්‍රතිපත්ති මත පිහිටිය යුතු ය. මෙතැන දී අවංකකම හා සත්‍යතාව මතුවිය යුතු යි. අන් අය රැවටීමට ගියොත් රැවටෙන්නෙත් තමන් ම ය.

තමන් වැරදි මඟ ගොස් සෙස්සන්ට නිවැරැදි මාර්ගයේ යන්නට කීම අතිශය වංචාවකි. මේ ව්‍යාජ ප්‍රතිපත්තියෙන් බැහැර විය යුතු ය.

බුද්ධ ධර්මය කාලත්‍රයට ම පොදුවූවකි. එය එක් අවදියකට පමණක් සීමා වූයේ නැත. කාලත්‍රයට ම බලපාන බුදුසමය පුද්ගලයාගේ දිවි පැවැත්මට අතිශයින් ම ඉවහල් වන්නකි.

පුද්ගලයා උදේ හවා කොතරම් බණ ඇසුවත් එම දිවියේ ප්‍රතිපත්ති නැත්නම් සරු මඟ නිසරු වෙයි. පෝය හතරටම සිල් සමාදන් වීමෙන් ඵලක් නොමැත. ප්‍රතිපත්ති රකින්නේ නැත්නම්. අපට බොහෝවිට දක්නට ලැබෙන්නේ ප්‍රතිපත්තිවලින් දුරස් වූ පුද්ගලයන් ය. පිළිවෙත විෂය මුල් කරගෙන කටයුතු කළහොත් දිවියෙන් ජයගන්නට එතරම් අපහසු නැත. ධර්ම මාර්ගයට පිවිසෙන පුද්ගලයා ගේ චරිත ය ද පිරිසුදු ය.

අප දිවි ගෙවන්නේ ඉතාම කෙටි කාලයකි. ඒ කෙටි කාලයේ දී බුද්ධ ධර්මයට අනුගත ව දිවි ගෙවන්නට යමකු සැරසුණහොත් එම පුද්ගලයා දිවියෙන් ජය ගන්නවා නිසැක ය.

### පල නෙළා ගැනීම

තමන් ලත් ආත්ම භාවයෙන් උපරිම පල නෙළා ගත යුතු ය. සමාජයේ බොහෝ දෙනා තමන් ලත් ආත්මය කෙරෙහි හැඟීමක් නොමැත. කිසිදු හැඟීමකින් තොරව දිවි ගෙවන ගමන අතිශය දුක්ඛදායක ය.

හැඟීමෙන් තොර දිවිය හිල් වූ කළයක් බඳු ය. හිල් වූ කළ ගෙඩියකට කොපමණ ජලය දැම්මත් ඵලක් නොමැත. හැඟීමක් නැති චරිතයත් එසේම ය.

යා යුත්තේ කිනම් ඉසව්වට ද යන්න කෙරෙහි හැඟීමක් අනිවාර්යයෙන් ම තිබිය යුතු ය. ආත්ම ජයග්‍රහණය කරා යන්නට හැඟීම අතිශයින්ම ඉවහල් වෙයි.

තමන්ට ධර්මයෙන් ලාබාපේක්ෂා ලබාගත හැකි ය. තමන් නොදන්නා බොහෝ කරුණු උකහාගත හැක්කේ ධර්ම මාර්ගයෙනි.

ධර්ම විෂයාශ්‍රිත භූමිකාව මත රැඳුණු දිවියේ පවත්නා සුගැඹුර විග්‍රහ කරන්නට ශබ්ද කෝෂවල වදන් නොමැති තරම් ය. ඒ තරමට ම එම දිවිය පෝෂිත ය. ධර්මයෙන් පිරිපුන් පුද්ගලයා සංවේදී ය. කිසිවකට කලබල නොවී තමන්ට එල්ලවන හැම දෙයක් ම ඉතා ඉවසීමෙන් යුතුව බාර ගන්නට සූදානම් වෙයි.

### ප්‍රතිභාපූර්ණත්වය

ඥානාන්විත පුද්ගලයා එකට එක කරන්නට නොගොස්, පළිගැනීමට ද යන්නේ නැතිව නිරහංකාර නිහතමානි දිවියකට ද අරඅදියි. මේ පුද්ගලයා කරන්නේ බහුල වශයෙන් සවන්දීම ය. තමන් නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින් අවශ්‍ය දේ පමණක් කියාපායි. තැන්පත් දිවියකට මුල පුරමින් ප්‍රතිභා පූර්ණත්වයක් එයින් මතුකරයි.

සමාජයේ සෙස්සන්ට පරමාදර්ශී දිවියකට මං පෑදීම ධර්ම මාර්ගයට පිවිසි පුද්ගලයාගේ කාර්ය භාරයයි.

ධර්මානුධර්ම වත් පිළිවෙත්වල නියැළුණු පුද්ගලයාගේ දිවි මඟ තේරුම් ගෙන ඒ ආශ්‍රිතව යන ගමන පුද්ගලයාට මෙන්ම සමාජයේ සෙස්සන්ට ද ප්‍රබල චරිතයක් වනවාට කිසිදු සැකයක් නොමැත. බුද්ධ ධර්මය නිසි අයුරින් පිළිපදින පුද්ගලයා යන ගමන පැහැදිලි ය. නිරවුල් ය. එමෙන්ම ගාම්භීර ද වෙයි.

මීළඟ බුදුසරණ කලාපය පොසොන් පුර අටවක ජූනි 18 සිකුරාද

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

**වෙසක් අමාවක 2021.06.09**

## ආලෝකය දකිනවා ද? අඳුරෙහි ගිලෙනවා ද?

"ඉන්න හිටින තැනින් අඩියක් හරි ඉස්සරහට තියන්නේ නැති නම් ඒ ජීවිතයෙන් පලක් නැතැයි" පැරැන්නෝ කීහ. ඉස්සරහට යැම නම් ජීවිතය යහපත් තැනකට ගෙනයැම ය. ආධ්‍යාත්මික ගුණ ධර්මයන්ගෙන් සේ ම භෞතිකමය දියුණුවෙන් ද ඉහළට යාම ය. ගෙවුණු ජීවිතය ගැන මොහොතකට ආවර්ජනය කළේ නම් ජීවිතය ඉදිරියට ගියේ ද, පසු පසට ගියේ ද යන්න පිළිබඳව තමන්ට ම තීරණය කළ හැකි ය.

අද ලෝකය මුහුණ දී සිටින අතිශය භයානක රෝග වෛරසය කොරෝනා උවදුර හමුවේ ඒ අවශ්‍යතාව ප්‍රායෝගික ව ම අපි හොඳින් අත්විඳිමු. කාලාන්තරයක් තිස්සේ තමන් ගැන ම පමණක් සිතූ මිනිසාතුළ වර්ධනය වූ ආධ්‍යාත්මික පරිහානිය සොබා දහමෙන් ලද මේ කුරිරු අකාරුණිකත්වයට හේතු නොවන්නේ යැයි කිසිවකුට ප්‍රකාශ කළ නොහැකි ය. එළැඹි මේ මොහොතේ සිට හෝ මේ පිළිබඳව සිතා බලා ජීවිතය යහපත් තැනකට හසුරුවා නොගන්නේ නම් හෙට දවස තවත් අඳුරු නොවේ යැයි කාට නම් කිව හැකි ද? මේ ඒ ගැන සිතන්නට කාලයයි.

කර්මානුරූප ව මිනිසත් බව ලැබ උපත ලැබුව ද, මිනිස් ජීවිතය විවිධාකාර ය. පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ය.

රැස් කරන ලද කුසලාකුසල කර්ම නිසා කවර ආකාරයක ජීවිතයක් ලැබුව ද මතු ජීවිතය සාර්ථක කර ගත හැකි වන්නේ ද තමන්ට ම ය. අඳුරෙන් මිදී ආලෝකයට ගමන් කළ හැකි වන්නේ තමන්ට ම ය. ඒ හොඳින් සිතා බලා කටයුතු කිරීමෙනි.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක භික්ෂූන් වහන්සේ අමතා දේශනා කොට වදාළේ පුද්ගලයෝ සතර දෙනෙක් මෙලොව ජීවත් වන බව ය. අඳුරෙන් අඳුරට යන්නා, අඳුරෙන් එළියට යන්නා, එළියෙන් අඳුරට යන්නා හා එළියෙන් එළියට යන්නා යනුවෙනි.

මෙලොව ඇතැමෙක් දුක සේ දිවි ගෙවති. ආහාර පාන අඩු ය. කුලයෙන් පහත් ය. අවලස්සන ය. පාංශු පිශාචයකු හෝ දැවී ගිය කණුවක් හෝ වැනි අවලස්සන ව, දකින අයගේ නොසතුටට හේතු ය. රෝග බහුල ය. එසේ වාසය කරමින් ම හේ කයින්, වචනයෙන්, මනසින් දුසිරිතෙහි හැසිරෙන්නේ ය. එසේ දුසිරිත් කොට මරණින් මතු ද නිරයෙහි උපදින්නේ ය. මේ අඳුරේ වෙසෙමින් අඳුරට ම යන තැනැත්තා ය.

මෙලෙසම දුක්ඛිත ව, රෝග පීඩාදිය බහුල ව, අවලස්සන ව ජීවත්වන තවත් පුද්ගලයෝ වෙති. ඔවුහු අඳුරු ජීවිතයක් ගෙවුව ද මේ ලැබූ ජීවිතයේ කයින්, වචනයෙන්, මනසින් දුසිරිතෙහි නොයෙදෙති. සුචරිතයෙහි යෙදෙති. එසේ තිදොරින් සුචරිතයෙහි යෙදී මරණින් මතු සුගතියෙහි උපත ලබති. මේ අඳුරෙන් එළියට යන පුද්ගලයා ය.


මේ ලොව ඇතැමෙක් ධනයෙන් ආඪ්‍යය. මහාසාර කුලයන්හි ඉපදී සිටිති. රූප සෝභාවෙන් යුතු ය. දැකුම්කළු ය. එහෙත් කයින්, වචනයෙන්, මනසින් දුශ්චරිතයෙහි ම යෙදෙති. ඉදින් මරණින් මතු සුවයක් නොවූ දුක්ඛිත නිරයෙහි උපදිති. මේ එළියෙන් අඳුරට යන්නෝ ය.

මෙලෙස ධනයෙන් ආඪ්‍ය, සැප සම්පත් පිරි, රූප සෝභාවෙන් යුතු මහාසාර කුලයන්හි උපන් තවත් පිරිසක් වෙති. ඔවුහු ආහාර පාන, ප්‍රදීප ලබා වාසය කරමින් කයින්, වචනයෙන් හා සිතින් ද සුචරිතයේ යෙදෙති. ඉදින් මරණින් මතු සුගතියේ ම උපදිති. මේ එළියෙන් එළියට යන පුද්ගලයෝ ය.

අද අපි ලෝකයේ යතාර්ථයට මුහුණ දෙමින් සිටිමු. මරණයේ වේදනාව, වෙන්ව යාමේ වේදනාව, සා පිපාසාවේ භයානක බව දෑසින් ම දකිමු. මේ ගැන හොඳින් සිතා ඉදිරි මඟ තීරණය කළ යුතුව ඇත. ඒ අඳුරට යනවා ද? ආලෝකයට යනවා ද? යනුවෙනි. ඒ ගමන් මඟ අන් කවරකුට හෝ අප රැගෙන යා නොහැකි ය. යා යුතු තමන් ම ය. ඒ සඳහා ශ්‍රී සද්ධර්මය අපට මඟ පෙන්වනු ඇත.

# ශාසන ඉතිහාසය හා ජාතියේ ඉතිහාසය කියැවෙන පාලි වංශකථා

**වංශ යනුවෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවයි. ඒ අනුව කිසියම් පුද්ගලයකු, විශේෂිත වස්තුවක හෝ රටක ඉතිහාසය හෝ පරම්පරාව ලියවී ඇති සාහිත්‍ය වංශකතා යනුවෙන් හැඳින්විය හැකි ය.**



කොළඹ විශ්වවිද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත
ආචාර්ය

**උඩුහාවර ආනන්ද හිමි**

**බෞද්ධ සාහිත්‍යය 07**

මෙම සාහිත්‍ය අංගයට වෛදික යුගය දක්වා දිවෙන දිගු ඉතිහාසයක් හිමිව තිබේ.

බෞද්ධ සාහිත්‍යය යටතේ පාලි වංශකථාවලට විශේෂ තැනක් හිමි වේ. ඒවා පසු කලෙක සිංහල භාෂාවට පරිවර්තනය වීම හේතුවෙන් සිංහල වංශකථා සාහිත්‍ය මෙරට සිංහල ජනයා අතර බෙහෙවින් ජනප්‍රියවී තිබේ.

ලංකාවේ සම්පාදිත සියලුම වංශකථාවල ඇතුළත් වන්නේ සිංහල ජාතියේ ඉතිහාසය මෙන්ම ශාසන ඉතිහාසයයි. එබැවින් ලක්දිව රචිත සියලුම වංශකථා ජාතියේ ඉතිහාසය මෙන්ම ශාසන ඉතිහාසය හැදෑරීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

සිංහල ජාතියත් බුදුදහමත් එකිනෙකට සම්බන්ධ කිරීමෙහිලා අවශ්‍ය පදනම නිර්මාණය වූයේ වංශකථා ඇසුරෙනි. විශේෂයෙන් ම සිංහල බෞද්ධ අනන්‍යතාව මෙන්ම සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රතිනිර්මාණය වීමට අවශ්‍ය වස්තුබීජ සැපයුනේ වංශකථා සාහිත්‍යයෙනි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව පවත්වන ලද පළමු හා දෙවන සංගායනා වාර්තාවලින් අනතුරුව ශාසන ඉතිහාසය පිළිබඳ කිසිදු තොරතුරක් පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ අන්තර්ගත නොවේ. ඉන් පසුව ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ පාලි අට්ඨකථාවල හා පාලි වංශකථාවල ය. ඒ අනුව ශාසන ඉතිහාසය පිළිබඳ අඛණ්ඩ වාර්තාවක් සැපයීමෙහිලා පාලි වංශකථාවලින් ලැබුණ දායකත්වය විශිෂ්ටය.

දීපවංශය ලංකාවේ රචිත වංශකථා සාහිත්‍යයේ පළ මුවැන්නයි. එහි රචකයා කවරෙක්දැයි නොදැක්වේ. මෙහි අන්තර්ගතය පරිච්ඡේද විසිදෙකකින් යුක්ත වේ. සිංහල ජාතියේ ඉතිහාසය මෙන්ම ශාසනයේ ඉතිහාසය ද සැකෙවින් ගෙනහැර දක්වන මෙහි බුදුරදුන්ගේ ත්‍රිවිධ ලංකාගමනය, පළමු දෙවන හා තෙවන ධර්මසංගායනා, ශාක්‍ය රාජ වංශයේ සමාරම්භයේ සිට මහින්දාගමනය දක්වා තොරතුරු, කකුසඳ ආදි සිව් බුදුවරුන්ගේ සමයන්හී ලක්දිව පැවති තත්ත්වය හා උන්වහන්සේලාගේ ශාසන ලක්දිව පිහිටුවීම ආදි තොරතුරු ඇතුළත් ශාසන වංශකථාවන් මෙහි අන්තර්ගත වේ.

මේ අනුව සිංහල ජාතියේ ඉතිහාසය මෙන්ම ශාසන ඉතිහාසය හැදෑරීමේ දී දීපවංශයේ ඓතිහාසිකත්වය කැපී පෙනේ.

දෙවන ඓතිහාසික මූලාශ්‍රය මහාවංශයයි. එහි මුල් පරිච්ඡේද තිස් හත මහානාම හිමියන් විසින් සම්පාදිත ය. ඉන් අනතුරුව වර්තමානය දක්වා විවිධ කතුවරුන් විසින් මහාවංශයේ සෙසු කොටස් සම්පාදනය කර තිබේ.

මෙම වංශකථා දෙක සම්පාදනය නොවූයේ නම් සිංහල ජාතියේ ඉතිහාසය හෝ ලක්දිව බුදුසසුනේ ඉතිහාසය පිළිබඳ කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි වේ. පාලි ගාථාවලින් සම්පාදනය කර ඇති මෙම ග්‍රන්ථ පසු කලෙක සිංහලට මෙන්ම ඉංග්‍රීසි භාෂාවලටත් පරිවර්තනය කර තිබේ.

වර්තමානයේ වුව ලංකා ඉතිහාසය හැදෑරීමේ දී භාවිත කරන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ මෙම වංශකථා දෙකයි.

යථෝක්ත ප්‍රධාන වංශකථා දෙක හැර වෙනත් විෂයන් යටතේ ලියවුණු වංශකථා රැසක් ලක්දිව ථෙරවාද බෞද්ධ සාහිත්‍යයට ඇතුළත්ව තිබේ. ඒ අතුරින් සංඝමිත්තා රහත් තෙරණිය විසින් මෙරටට වැඩම කරවන ලද ශ්‍රී මහබෝධීන් වහන්සේ පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් කරමින් රචිත වංශකථාව මහාබෝධිවංශයයි. එහි ලංකාවේ ඉතිහාසය මෙන්ම ලක් බුදුසසුනේ ඉතිහාසය ද ඇතුළත්කොට තිබේ. එසේම බෞද්ධයන් විසින් බෝධි වන්දනයේදි භාවිත කෙරෙන "යස්සමූලේ නිසින්නෝව" යන ප්‍රකට ගාථාව ඇතුළත් වන්නේ බෝධිවංශයේ ය.

ලක්දිව බෝධි සංස්කෘතිය හා සම්බන්ධ පුදපූජා වත්පිළිවෙත් නිර්මාණය වූයේ බෝධි වංශය ඇසුරෙනි.

දුටුගැමුණු මහා රජු විසින් ඉදිකරන ලද මහාථූපය හෙවත් රුවන්වැලි මහාසෑය පිළිබඳ ඓතිහාසික තොරතුරු මෙන්ම වෙනත් ශාසනික තොරතුරු ඇතුළත් කරමින් රචිත වංශකථාව ථූපවංශයයි. ලක්දිව ස්ථූපකරණය හා ඒ හා සම්බන්ධ පුද පිළිවෙත් නිර්මාණය වීමෙහිලා ථූපවංශයෙන් ලද දායකත්වය කැපී පෙනේ. කිත්සිරිමෙවන් රජ දවස හේමමාලා හා දන්තකුමරු යන දෙපළ විසින් මෙරටට වැඩමකරවන ලද ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් රචිත ග්‍රන්ථය දාඨාවංශය නමින් හැඳින්වේ. දළදා වහන්සේ හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු එහි අන්තර්ගත වේ.

දළදා සංස්කෘතිය හා බැඳුණු ආගමික විශ්වාස පද්ධතිය සැකසීමෙහිලා මෙම වංශ කථාව බෙහෙවින් උපයෝගී වී තිබේ.

බුදුරදුන්ගේ කේශධාතු සය නමක් මූලික කරගෙන ඉදි කළ දාගැබ් හයක් පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් වංශකථාව ඡකේසධාතුවංශය නමින් හැඳින්වේ.

11 පිටුවට ...

# දුක සේ ලැබිය යුතු මිනිසත්බව

**මෙම දීර්ඝ වූ සසර ගමන තුළ අවයවයන්ගේ විකල බවක් නොමැතිව මිනිස් සිරුරක් ලැබීම ඉතා අපහසු කරුණකි. සීසෑම්, වෙළඳාම් කිරීම් ආදී නොයෙක් කම්කටොලු විඳිය යුතු බැවින් ද, ජරාවෙන් පෙළෙන බැවින් හා මඳ කලක් පවත්නා බැවින් දිවි පැවැත්ම ද ඉතා දුෂ්කර ය. කප්කෙළ සුවහස් ගණනකිනුදු සදහම් දන්නකු හෝ දෙසන්නකු නො ලද හැකි බැවින් සදහම් ඇසීම ද දුලබ ය.**

බුදුවරයන්ගේ ලොව පහළවීම කප්කෙළ සුවහස් ගණනකිනුදු සිදු නොවන බැවින් බුදු උපත ද ඉතා දුර්ලභ ය. එසේම මෙම සියලු දුර්ලභ කාරණා මනාව බැඳී පවතිනුයේ මනුෂ්‍ය ලෝකය හා සම්බන්ධ ව බැවින් මනුසත් ආත්ම භාවයක් ලබා ගැනීම ලොව පවත්නා අතිශය දුර්ලභ ම කාරණාව වේ.

එබැවින් එවැනි උතුම් මිනිසත් බවක් ලැබීම කණකැස්බෑවකු වියදඬු සිදුරෙන් අහස බැලීමටත් වඩා ඉතා දුෂ්කර කාර්යයකි.

මහ මුහුදෙහි දැමූ වියදණ්ඩුව සිව් දිශාවෙන් හමන සුළඟින් ඒ ඒ දිසාවට ගෙන යයි. මහ මුහුද පත්ලෙහි වෙසෙන කණ කැස්බෑවා අහස බලනුයේ අවුරුදු සිය ගණනකට පසුව වන අතර, සතර දිශාවට සුළඟේ වේගයෙන් ගෙන යනු ලබන එම වියදඬුවෙහි සිදුරින් අහස බැලීමට ඒ කණකැස්බෑවාගේ ඇසට එල්ලවීම යම් සේ දුෂ්කර වේ ද, එයටත් වඩා මිනිසත් බව ලැබීම වනාහී සසර ගමන තුළ ලැබිය හැකි ඉතාමත් දුෂ්කර ම මෙන්ම, දුර්ලභම කාර්යය වන්නේ ය.

කාමසුගති භූමි වශයෙන් සැලකෙනුයේ චාතුර්මාහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මානරතිය, පරනිම්මිත වසවර්තිය සහ මනුෂ්‍යය ලෝකය යන සප්තවිධ කාම ස්වර්ගයයි. මිනිස් ලොව පරමායුෂ ඇතැම් කල්පවල අවුරුදු ලක්ෂය දක්වා වර්ධනය වන බවත්, එහෙත් එය වර්තමානයේ එකසිය විස්සක් වූ පරමායුෂයට අවරෝහණය වී ඇති බවත් පෙනේ. එම ආයුෂ ප්‍රමාණය ද තවදුරටත් ක්‍රමක්‍රමයෙන් නොනවත්වා ම අඩුවෙමින් පවතිනු දැකිය හැකි ය.

එක් අවස්ථාවක දී දෙව්ලොව සියලු දෙවියන්ට අධිපති ශක්‍රදේවේන්ද්‍රයා තම රථාචාර්ය වන මාතලී දිව්‍ය පුත්‍රයා සමඟ ගමන් කරන අවස්ථාවක දී පෘථිවිය දෙසට හැරී තෙවරක් නමස්කාර කළේ ය. එවිට එයට හේතුව විමසූ කල්හි ශක්‍ර දේවේන්ද්‍රයා මාතලී දෙව් පුතු අමතා ප්‍රකාශ කරනු ලැබුවේ,

**“යේ ගහට්ඨා පුඤ්ඤකරා –
සීලවන්තා උපාසකා
ධම්මේන ලද්දං පෝසෙන්ති –
තං නමස්සන්ති මාතලි”** යනුවෙනි.

පූර්වෝක්ත ගාථා ධර්මයට අනුව එසේ නමස්කාර කොට ඇත්තේ මිනිස් ලොව බොහෝ ලෙස පින්දහම් කරන, එසේම ධර්මානුකූල ව ජීවත් වන මනුෂ්‍යයන්ට මිස වෙන කිසිවකුටත් නොවන බව එහි සඳහන් වේ.

මේ අනුව දෙවියන්ට පවා පින් අනුමෝදන් වියහැකි නමුත්, කාමාවචර කුසල් දහම් කිරීමේ හැකියාව ඇත්තේ ද මනුලොව උපන් මිනිසුන්ට පමණී. එසේම බුදු, පසේබුදු, මහරහත් යන තුන්තරා බෝධියට පත්වන්නේ ද මිනිස් ලොව උපන් මනුෂ්‍යයකු මිස දෙව්ලොව උපන් දෙවියකු නොවේ.

ඒ නිසාම තථාගත ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ද බෝසත් අවදියෙහි කිඹුල්වත් නුවර උපත ලබා උතුම් බුද්ධත්වය අවබෝධ කිරීමට පෙර වැඩ සිටියේ තුසිත දෙව් ලොව සන්තුසිත නම් දිව්‍ය පුත්‍රයා වශයෙනි.

එහෙත් දිව්‍ය ආත්මයේ දී බුදුවිය නොහැකි වන අතර, මිනිස් ආත්මභාවයක් ඒ සඳහා ලැබිය යුතුම වේ. ඒ ලබන්නාවූ මිනිස් ආත්මය පුරුෂයෙක් ව ඉපදීම ද, එසේම එම පුරුෂ තෙම පැවිද්දෙක් විය යුතු බව ද අභිනීහාරය සමෘද්ධ වීමට හේතුවන කරුණු අතර ප්‍රධානතම කරුණු ය.

**“මනුස්සත්තං ලිංග සම්පත්ති –
හේතු සත්ථාර දස්සනං
පබ්බජ්ජා ගුණ සම්පත්ති අධිකාරෝ
ච ඡන්දතා”** යන ගාථාවෙන් එය පැහැදිලි වේ.

දෙව්වරු දිව්‍ය ලෝකයෙන් චුත වීමට ආසන්න අවස්ථාවේ එසේ චුතවීමට ආසන්න දෙවියන් කැඳවාගෙන ගොස්, දෙව්ලොව නන්දන නම් උද්‍යානයට සියලු දෙනා රැස්ව ඒ දෙවිඳු වටකරගෙන “මෙයින් චුතව ගොස් සුගතියෙහි උපත ලබා දුර්ලභ මිනිසත් ආත්ම භාවයක් ලබමින් ධාර්මිකව ජීවත් වී පින් දහම් කරනු මැනවි” යනුවෙන් මෙවැනි අනුමෝදනාවක් කරති.

දිව්‍ය ලෝකයේ වාසය කරන දෙවියන්



මාදන්වල ශ්‍රී ධර්මෝධය මහ පිරිවෙනේ ආචාර්ය,
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
**ලේල්ඔයේ සෝභිත හිමි**

පෙන්වන මෙන්ම හඳුන්වා දෙනු ලබන සුගතිය වනාහී මෙම මනුෂ්‍ය ලෝකය බව ඉන් පැහැදිලි වේ.

දෙව් ලොවින් චුතවන බොහෝ දෙව්වරු එයින් චුතව නැවත උපත ලබනුයේ වැඩි වශයෙන්ම මෙම මනුෂ්‍ය ලෝකයේ වන බැවින්ද, දෙවියන්ට පවා සිදුකළ නොහැකි ලෙස මහත් දන් පින්කම් ආදි කුසල කර්ම කිරීමට හැකියාව ඇති බැවින්ද, එසේම තුන් ලොවටම උතුම් වූ බුදු පදවිය ලබාගත හැකි එකම ස්ථානය වන බැවින් ද දෙව්වරු මනුෂ්‍යය ලෝකය මෙසේ සුගතියක් යැයි සලකති.

දෙවියන් වනාහි ඕපපාතික ව පහළ වන අතර, නියමිත කාල සීමාවක සිට ඉන් චුත වී මිනිස් ලොව හෝ වෙනත් සත්වයකු වී හෝ නැවත උපත ලබයි. පෘථිවි වර්ෂ ගණන්වලින් දින හතකට මත්තෙන් චුතවන පෙර නිමිති පමණක් පහළ වෙතැයි අටුවාව කියයි.

එසේම ඉහත සඳහන් මෙම දිව්‍ය ලෝකයන්හි කාල නිර්ණය කර ඇත්තේ පෘථිවි වර්ෂවලින් වන අතර චාතුර්මහා රාජිකයෙහි දිනයක් යනු පෘථිවි වර්ෂ 50 කි. තාවතිංසයෙහි එක් දිනයක් පෘථිවි වර්ෂ 100 කි. පෘථිවි වර්ෂ 200 ක් යාමය දෙව් ලොවෙහි එක් දිනයකි. තුසිතයෙහි එක් දිනක් පෘථිවි වර්ෂ 400 කි. පෘථිවි වර්ෂ 800 ක් නිම්මාණරතියෙහි එක් දිනයකි. පරනිම්මිත වසවත්තියෙහි එක් දිනක් යනු පෘථිවි වර්ෂ 1600 කි. ඒ අනුව, සදිව්‍ය ලෝක තුළ මිනිස් ලොවට සාපේක්ෂ ව ආයුෂ කෙබඳු වන්නේ ද යන්න අවබෝධ කරවීම කෙරෙහි පහත දැක්වෙන කථා පුවත ඒ සඳහා මහත් ආලෝකයක් සපයයි.

සැවැත් නුවර එක් කුල ගෙයක උපන්නා වූ එක් ළදැරියකට පෙර ජාති සිහිකරන නුවණ පහළ විය. පසුව දෙවඟනක් ව සිට මිනිස් අඟනක් ව උපන් බව දැනගත් ඇය තව්තිසා දෙව් ලෝ වැසි මාලාභාරි දෙවියන්ගේ දහසක් දෙවඟනන් අතුරෙන් කෙනෙකි.


දිනක් ඒ දෙව්ඹු දහසක් දිව්‍යාංගනාවන් පිරිවරා මල් නෙළනු සඳහා උයනට පිවිසියහ. ඒ අතරින් මැයගේ පින් ගෙවී ආයුෂ ගෙවුණු බැවින් මල් උයනෙහිම දමා මෙසේ සැවැත් නුවර කුල ගෙයක දියණියක් ව ඉපදුණි. පසුව තමා තව්තිසා දෙව්ලොව සිට පැමිණි බවත්, එසේම මාලාභාරී දිව්‍ය පුත්‍රයා තම ස්වාමියා බවත් දැනගත් ඇය එතැන් පටන් සැදැහැයෙන් යුතුව මල් පහන් පුදා එම දෙව්පුත් අභියසම නැවත ඉපදීමට නිරන්තරයෙන් ප්‍රාර්ථනා කළා ය. එනිසාම ඇය පතිපූජිතා යන නමින් ද ප්‍රසිද්ධ විය.

පතිපූජිතාව සඟ උවටැන් නිරතුරුව ම කළ අතර හැමදීම්, අසුන් පනවා තැබීම්, පැන් පෙරා තැබීම්, දන් පිළියෙල කිරීම් මනාව කරනු ලැබී ය. එසේම පුත් කුමාරවරු සිව් දෙනකු ලැබූ ඇය හදිසියේ හටගැනුණු රෝගයකින් මියගොස් තව්තිසා දෙව්ලොව මාලාභාරී දෙව්පුත් අභියසම නැවත ඉපදුණි. එතෙක් උදෑසන පැමිණි දෙව්ලොව මල් නෙළන දෙවඟනෝ මල් නෙළති. මල් පළඳවන දෙවඟනෝ මල් පළඳවති. මිනිස් ලොවින් අවුරුදු සියයක් තව්තිසා වැසි දෙවියනට එක් දවසක් බැවින් අවුරුදු සියයක් මිනිස් ලොව සිටියත් ඒ දෙවියනට එය එක් දවසකි. එබැවින් පතිපූජිතාව මිනිස් ලොව ඉපිද විසූ කාලය දෙව්ලොවට ඇසිල්ලක් බඳු කාලයකි. එනිසා ඒ දෙවඟනගේ චුතවීම හා පහළවීම පිළිබඳ ඇසුරු කළ දෙව් පිරිසට දැනගත නොහැකි විය. සඟ උවටැනෙහි ලැදිව සිටි ඒ කුළඟනගේ මරණය බුදු රදුන්ට සැළවීමෙන් ඒ නිමිති කොටගෙන, “පස්කම්හි ඉතා ගිජුව ඇලුණු මිනිසා එහි සෑහීමකට නොපැමිණීම මරු වසඟ කරන්නේ ය” යැයි දහම් දෙසූහ.

මේ අනුව මෙසේ අතිශයින් දුර්ලභ ව ලැබිය යුතු මිනිසත් ආත්මයක් ලබා ඇති අප සැම දෙනා ද එහි වටිනාකම හා වැදගත්කම මනා ලෙස අවබෝධ කොටගෙන මෙලොව යහපත් ව ජීවත්වීමට නිරතුරුව ම උත්සාහ කරමු.

# මහා පුරුෂ ලක්ෂණයෙන් ප්‍රභාවත් වූ බුදු සිරුරේ අසිරිය

**උන්වහන්සේ නෙළුම් මලකට උපමා වන්නේ ය. නෙළුම් ගස හැදී වැඩෙන්නේ ගොහොරු මඩක ය. මහත් වූ ජල තරලයක් ඉක්මවාගෙන ජලය ද, පත්‍රවල ද නො ගැටී නො ගෑවී ජලයෙන් ඉස්මතු වී සිටී.**



**බුදුරජාණන් වහන්සේ යනු කවුද? යන පැනයට ලැබෙන පිළිතුරු රාශියක් ඇත. ධර්මය අවබෝධ කරගෙන ලෝක සත්වයාට දේශනා කළේ බුදුරජාණන් වහන්සේ ය. බුද්ධියෙන් හා ප්‍රඥාවෙන් අවබෝධ කළ තැනැත්තා යනුවෙන් ද, කෙලෙස් තැවූ නිසා ද, නිවන් අවබෝධ කළ නිසා ද, ක්ලේෂයන් තවා උත්තරීතර තත්වයට පත්ව සමාජ සත්වයා උදෙසා ධර්මය අවබෝධ කොට නිවන් පසක් කර ගැනීමට ඉඩහසර කියා දුන්නේ තථාගතයාණන් වහන්සේ විසින්ම ය.**

**එබැවින් ම තථාගත බුදුරජාණන් වහන්සේ මිහිපිට වැඩ සිටි උත්තරීතර ම මිනිසා ද වන්නේ ය. පද්මෝප දේශයේ පැහැදිලි වෙන පරිදි නම් උදය බමුණාට පා සලකුණු දැක එබඳු වූ පා සටහන් ඇති තැනැත්තා කවුද? යන පැනයට පිළිතුරු වශයෙන් බුදුන් වහන්සේ ම පැහැදිලි කරන පරිදි මෙලොව කෙලෙස් තැවූ යමෙක් වන්නේ ද ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේ නෙළුම් මලකට උපමා වන්නේ ය. නෙළුම් ගස හැදී වැඩෙන්නේ ගොහොරුමඩක ය. මහත් වූ ජල තරලයක් ඉක්මවාගෙන ජලය ද, පත්‍රවල ද නො ගැටී නො ගෑවී ජලයෙන් ඉස්මතු වී සිටී.**

බුදුරජාණන් වහන්සේ ඊළග හැඳින ගැනීමට මහත් වූ වැදගත්කම වන්නේ නව අරහාදී බුදු ගුණ ය. එබඳු ගුණ නවයක් ලෙස දහමේ දැක්වේ. අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර, පුරිස දම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධො භගවා යනුවෙනි.

බුදුරදුන් සතු ගුණ ධර්ම වශයෙන් ගුණ නවයක් වුව ද, ඊටත් වඩා බුදු ගුණය බුදු සිරිත තුළින් ප්‍රකට කෙරේ.

වීදගම මාහිමියන් රචනා කළ බුදුගුණාලංකාරය ග්‍රන්ථයේ බුදු ගුණ පිළිබඳ මනා ලෙස කාව්‍යකරණය කෙරේ. බුදුරජාණන් වහන්සේ පිළිබඳ නියම ලෙස දැන හඳුනා ගන්නේ කෙසේද? ධර්මය කෙබඳුවේද, යන ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙන බුදුරජාණන් වහන්සේ දේශනා කරනුයේ,

"යො ධම්මං පස්සති, සො මං පස්සති
යො මං පස්සති සෝ ධම්මං පස්සති"

යනුවෙනි.

යමෙක් ධර්මය දකින්නේ ද ඒ අනුව මා දකින්නේ ය. යමෙක් මා දකින්නේ ද ඔවුහු ධර්මය දකිති. යනුවෙන් සඳහන් වේ.

මේ වාක්‍ය හා ප්‍රකාශය මඟින් පෙනෙනුයේ බුදුරජාණන් වහන්සේ යනු කෙබඳු කෙනෙක් ද යන්න පිළිබඳව ය.

බුදුරජාණන් වහන්සේ දෙවියන්ටත් වඩා දෙවි කෙනෙකි. (දේවාති දේව) බඹුන්ටත් වඩා බඹෙකි. (බ්‍රහ්මාති බ්‍රහ්ම) සිද්ධාර්ථ කුමාරොත්පත්තියේ සඳහන් ආකාරයට "මම ලොවට අග වෙමි. ශ්‍රේෂ්ඨ වෙමි. ජ්‍යෝෂ්ඨ වෙමි" යන ප්‍රකාශනයෙන් ඒ බව ප්‍රකට වන්නේ මහා පුරුෂයකු ලෙස පිළිගැනීම කුඩා අවදියේ දීම සිදු වූ බවයි. ඒ අතරට ගරු බුහුමන් ලැබීම ද තවකෙකි.

සුද්ධෝදන රජු විසින් සිය ගුරු දේවයන් වෙත තම පුත් රුවන දක්වන වේලාවේ කුඩා සිදුහත් කුමාරයාගේ දෙපා කාලදේවල තාපසතුමාගේ ජටාවේ රැඳුණි. මේ නිසා පළමුව ද, දෙවැනිව ද, තෙවැනිව ද පියතුමාගේ වැඳීමට පාත්‍ර විය.

මේ කරුණු කාරණා නිසාම බෝසත්හු කුඩා අවදියේ සිටම බොහෝ දෙනාගේ චිත්තප්‍රසාදයට පාත්‍රවූ බවක් පෙනී යයි.

මෙහි වැදගත්වන කරුණක් නම් මුල් කාලීනව බුදුරජාණන් වහන්සේගේ රූපකාය දැක්වීමේ දී ප්‍රතිමා නිර්මාණය නො කරන ලදී. ඒ වෙනුවට බුදුරජුන් සංකේතවත් වන පරිදි ශ්‍රී පතුල, ශ්‍රී පද්මය, බෝධි වෘක්ෂය, බුද්ධ රශ්මිමාලා, චක්‍රය, දාගැබ (චෛතිය) ධර්ම චක්‍රය ආදී විවිධ මුද්‍රා ක්‍රම භාවිත කරන ලදී. මුල් කාලීනව සාංචි, භාරුත් ආදී කැටයම්, බෞද්ධ චිත්‍රකලා, ඉතිහාසයේ දී අජන්තා, එල්ලෝරා චිත්‍රවල දී මේ බව දක්නට ලැබේ.

ඒ අනුව මුල්ම බුද්ධ රූපය නිම වූවා සේ කියැවෙන්නේ "මෙබඳු වූ සුවාසූ දහසක් ධර්මස්කන්දය දෙසා වදාළ උත්තරීතර ශ්‍රේෂ්ඨයාණන් වන්නේ කවුදැයි" විමසූ, සෙවූ ධර්මාශෝක අධිරාජ්‍යයා වෙත 'අනන්ත" නම් නා රජු හරහා දැකීමට සැලැස් වූ සිහිනයක් සමඟ රජු දුටු බුදු සිරුර දක්ෂ වඩුවෙකු ලවා හඳුන් අරටුවක නිර්මාණය කරවූහ. තව ද පසු කාලය වන විට සාංචි, භාරුත් මථුලා, පල්ලව යන කලා කාලයේ දී බුද්ධ රූප නිර්මාණය කළ බවට සාධක සොයා ගෙන ඇත.

තවද පසු කාලය වන විට සාංචි, භාරුත්, මථුලා, පල්ලව යන කලා කාලයේ දී බුද්ධ රූප නිර්මාණය කළ බවට සාධක සොයා ගෙන ඇත. පසු කාලීනව ග්‍රීක කලාවට යම් ආභාෂිත ව බුද්ධ රූපය නිම වූ බව කියැවේ.

බුදුරජාණන් වහන්සේ තුළ පැවැති රූප කාය පිළිබඳ විස්තර වන අවස්ථා ත්‍රිපිටකාගත කරුණු ආශ්‍රයෙන් විස්තර ගෙන හැර දැක්විය හැකි ය. ශ්‍රීමත් තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේට පැවැති රූපකාය තුළ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් ද, අසූවක් අණුව්‍යඤ්ජන ලක්ෂණයෙන් ද, කේතුමාලා බ්‍යාමප්‍රභා අසිතිහස්ත ප්‍රභා යන රශ්මීන්ගෙන් ද යුක්ත වන තථාගත දේහය ඉතා ශ්‍රීමත් ය. අන් කෙනකුට තබා දෙවියකු හෝ බ්‍රහ්මයකුට එබඳු ශ්‍රීමත් ශරීරයක් නැත. තීර්ථකයන් දමනය කොට තව්තිසා දෙව්ලොවට වැඩ වදාරා සක්දෙව් රජුගේ පාන්ඩුකම්බල ශෛලාසනයෙහි හිඳ අභිදම් දෙසීම සඳහා වැඩහුන් කල්හි දසදහසක් සක්වළින් පැමිණි දේව බ්‍රහ්මයෝ උන් වහන්සේ වටා සිටියහ.. ඒ මහා පිරිසෙහි රූප ශෝභාවෙන් තථාගතයාණන් වහන්සේ යටපත් කළ හැකි එක දෙවියකු, එක බඹකු හෝ නොවූ බවත්, සකල දේව බ්‍රහ්මයන්ගේ රූප සෝභාව ඉක්මවා තථාගතයාණන් වහන්සේ ම බැබළුණු බවත්, සූවිසි මහා ගුණය නැමැති ධර්ම ග්‍රන්ථය ලියූ ථේරුකානේ චන්දවිමල මහා තේරපාදයාණන් වහන්සේ විසින් දක්වා ඇත. ඒ භාග්‍යවතුන් වහන්සේ සතුව පැවැති ශ්‍රී භාග්‍යම ය වන්නේ ය.

වරෙක පිඩු සිඟා වඩින තථාගතයාණන් වහන්සේ දකින වක්කලී නම් බ්‍රාහ්මණයා බුදු රදුන්ගේ රූපය දෙස බැලීමේ ආශාවෙන් පසුවූහ. පසුව බුදු සසුනේ පැවිද්ද ලබා උන්වහන්සේ දෙසම බලා සිටින්නට විය.

තවත් වරෙක මාගන්ධියා නම් රූපවත් බැමිණී කුමරිය බුදුරදුන්ගේ රූප කායට වසීකෘත ව උන්වහන්සේ විවාහ කරවා දෙන මෙන් සිය මව්පියන්ගේ ඉල්ලා සිටියාය. බුදු සිරුර දුටු ජත්ත මානවක සිය ආහ්ලාදය ගාථාවලින් ප්‍රකාශ කළ අතර තරුණ සිදුහත් කුමරු දුටු කිසාගෝතමී නම් තරුණ කුමරිය ද ශාන්ත වූ ලීලාවෙන් ගමන් කරන සිදුහත් කුමරා පිළිබඳ කළ ප්‍රසාදනීය වර්ණනාව පිළිබඳව ද සඳහන් වේ.

තථාගත බුද්ධ ශරීරය සෝභාමත් කෙරෙන ශරීර ලක්ෂණ තිස් දෙකක් පිළිබඳව ලක්ඛණ සූත්‍රයේ මෙසේ දක්වා ඇත.

ඊට අනුව ලුහුඬින් නමුත් විස්තර දීම සුදුසු යැයි සැලකේ.

සුප්පතිට්ඨිත පාද, හෙට්ඨාපාද තලෙසු චක්ඛානි ජාතානි ආයතපණ්හි, දීඝංගුලි, මුදු තලුන හත්ථපාදෙ, ජාල හත්ථපාදෝ, උස්සංඛපාදෙ, එණි ජංඝෝ, ඨිතකොව අනොමමන්තො උභොහි කොසොහිත වත්ථ ගුය්හො, සුවණ්ණවණ්ණො,සුඛුමච්ඡවි, එකෙක ලොමෝ, උද්ධග්ගලොමෝ, බ්‍රහ්මජ්ජුගත්තො,සත්තුස්සදෝ. සීහපුබ්බද්ධකායො, විතන්තරංසො, නිග්‍රෝධ පරිමණ්ඩලො, සමවත් තක්ඛන්ධො, රසග්ගසග්ගී, සීහහනු. චත්තාලීස දන්තො, සමදන්තො, අවිවරදන්තො, සුසුක්ක දාඨො, පහූත ජිව්හෝ, බ්‍රහ්මස්සරොහොති කරවීකභාණී, අභිනීල නෙත්තෝ, ගෝපමඛෝ, උණ්හීස සීසෝ හෝති යනුවෙන් දෙ තිසකි.

### සුප්පතිට්ඨිත පාදො

බුදුරජාණන් වහන්සේ පය බිම තබන කල්හි මනා කොට මුළු මහත් පා සටහනම එක සේ පොළොවේ පිහිටති. මෙය මහා පුරිස ලක්ෂණයකි.

### හෙට්ඨපාදතලෙසු චක්කානි ජාතානි

භාග්‍යවතුන් වහන්සේ යටිපතුල් යුවලෙහි දහසක් ලාංජන පිහිටා ඇත. ඒ ද මහා පුරුෂයකුට පිහිටන දෙයකි.

### ආයතපණ්හි

දික් වූ විළුම් ඇති බව ප්‍රකාශ වේ. සාමාන්‍ය මිනිසාගේ පතුල්වලට වඩා බුදුරජාණන් වහන්සේ ගේ දෙපතුල මුල් කොටස මදක් ඉදිරියට ඇති අතර තෙවන කොටස සිහින් ව සෝභමාන ලෙස පසුපසට විළුඹ ඇතිව මනාව පිහිටා ඇත.

### දීඝංගුලි

සෙසු මිනිසුන්ගේ ඇඟිලිවලට වඩා බුදුරජාණන් වහන්සේගේ අත්පාවල ඇඟිලි මුල මහත්ව ද අගින් සිහින්ව ද සමව පිහිටා ඇත.

### මුදු තලුන හත්ථපාදො

බුදුරදුන්ගේ අතුල් පතුල් උපන් සැටියේ දරුවකුගේ අතුල් පතුල් මෙන් මෘදුව ඇත්තේ ය.

### ජාලහත්ථ පාදො

බුදුරජාණන් වහන්සේ ගේ දෑත් දෙපාවල ඇඟිලි දක්ෂ ශිල්පියකු ලවා ලියවා මට සිළුටු කරන ලද රන් රුවක් සේ අක්මුල් හා සන්ධිස්ථාන මනාව පෙළට හා සමව පිහිටා ඇත්තේ ය.

### උස්සංඛපාදො

බුදුරජාණන් වහන්සේගේ පාදයෙහි ගෝප් ඇට අන්‍යයන්ගේ ගෝප් ඇට මෙන් නොව ඉහළින් පිහිටා ඇත්තේ ය . එහෙයින් පහසුවෙන් ක්‍රියාකළ හැකි පරිදි ගමන් කළ හැකි ය.

### ඒණිජංඝෝ

බුදු රජාණන් වහන්සේ ගේ ජංගාවෝ සෙසු මිනිසුන්ගේ මෙන් නොව මනාකොට ඒණි මුවන් ගේ ජංගා මෙන් පිටුපසින් මස් ගොබයෙන් වම්කුරුව ඇත්තේ ය.

### ඨිතකෝච අනොමන්තෝ උභොහි

පාණිතලෙහි ජණ්ණුකාමී පරිවසති. පරිමජ්ජති

සෙසු පුරුෂයන්ගේ මෙන් නොව බුදුරජාණන් වහන්සේ ගේ දණ නො නැමී අත ගා හැකි ය. ඒ අනුව මනාකොට දෙඅත් පිහිටා ඇත්තේ ය.

### කොසොහිත වත්ථගුය්හො

කෝෂයකින් වැසුණු පුරුෂ ව්‍යංජනයක් ඇති බව මෙම ලක්ෂණයෙන් නිරූපිත ය.

### සුවණ්ණවණ්ණො

තථාගතයාණන් වහන්සේගේ ශ්‍රී දේහය ඔපලා ඇති ස්වර්ණයක් මෙන් ස්වර්ණ වර්ණ ව ඇත්තේ ය.

### සුඛුමච්ඡවී

තථාගතයාණන් වහන්සේගේ සිරුරේ සම තුනී ය. එබැවින් එහි කුණු, දූවිලි ආදිය නො තැවරේ. නෙළුම් පතකට ලූ පිනි බිඳු එහි නො ඇලී ඉවත් වන්නාක් මෙන් ඉවත් වෙයි.

### එකෙක ලොමො

බුදුරජාණන් වහන්සේගේ ලෝම කූපයක එක් ලෝමයෙක් පමණක් ඇති අතර සෙස්සන් ගේ ලෝම කූප දෙක තුන වැඩෙති.

### උද්ධග්ග ලොමෝ


සෙසු අයගේ ලෝම නන් අයුරින් විහිදී පිහිටා ඇති අතර බුදුරදුන්ගේ ලෝමයන් දකුණට කරකැවී ඇත.

### බ්‍රහ්මජ්ජුගත්තෝ

බොහෝ දෙනාගේ ශරීරය ඉදිරියට හෝ පසුපසට නැමී ඇති අතර, තථාගතයන් වහන්සේගේ ශරීරය ඍජුව බ්‍රහ්මයාගේ මෙන් පිහිටා ඇත.

### සත්තුස්සදෝ

බොහෝ දෙනකුගේ ශරීරවල ඇට නහර මස් ගොබ එල්ලී පවතින අතර තථාගතයාණන් වහන්සේගේ ශරීරයේ එසේ ඇට , මස්, නහර ඉලිප්පී නැත. එය මහා පුරුෂයකුගේ ශරීර විලාසයයි.



### සීහපුබ්බද්ධකායෝ

බුදුරජාණන් වහන්සේගේ ශරීරය පරිපූර්ණ ව සිංහයකුගේ ලක්ෂණ ගතියි.

### විතන්තරංසො

සෙසු පුරුෂයන්ගේ පිට ප්‍රදේශය දෙපසට දෙපළුව පිහිටා ඇති අතර තථාගතයාණන් වහන්සේගේ පිට ප්‍රදේශය තනි කෙළින් ඇති ලෑල්ලක් සේ සමතලාව පිහිටා ඇත.

### නිග්‍රෝධ පරිමණ්ඩලො

බුදුරජාණන් වහන්සේගේ රූප කාය උසට සරිලන මහතත්, මහතට සරිලන උසත් ගැළපී ශරීර සෝභාවෙන් යුක්ත ය. නුග ගසේ උස, දිග, පළලින් සම වන්නා සේ ය.

### සමවත්තක්ඛන්ධෝ

තථාගතයාණන් වහන්සේගේ ගෙළ රන් කළසක කර සෙයින් මනාව වටවී සිටින්නේ ය. කතා කිරීමේ දී සෙසු අයගේ නහර ඉලිප්පී තිබුණ ද බුදුන් වහන්සේගේ එසේ නැත.

### රසග්ගසග්ගි

තථාගතයාණන් වහන්සේගේ ශරීරයේ සත් සියයක් රසනහර උඩුකුරුව ගොස් ග්‍රීවය තෙක් පිහිටා තිබේ. එනිසාම රස ඕජෝගුණය මුළු මහත් ශරීරයට එකසේ පැතිරී යයි.

### සීහහනු

සිංහයාගේ උඩු හක්ක අසම්පූර්ණ වෙන අතර යටි හක්ක සම්පූර්ණ ය. එහෙත් බුදුරජාණන් වහන්සේගේ යටි හක්ක මෙන්ම උඩු හක්ක ද සම්පූර්ණ ව පිහිටා ඇත.

### චත්තාලීස දන්තො

බුදුරජාණන් වහන්සේගේ හනු සම්පූර්ණ බැවින් දත් විස්ස බැගින් දෙහණුවෝ ම දත් සතළිහක් පිහිටා ඇත.

### සමදන්තෝ

සෙසු අයගේ දත් සම නොවී විවිධාකාර ලෙස පිහිටා ඇත. බුදුරජාණන් වහන්සේ දත් සමසතලිස් ආකාරයෙන් පිහිටා ඇත.

### අවිවරදන්තෝ

තථාගතයාණන් වහන්සේගේ දත් දෙපෙළ එකිනෙකට මනාව පිහිටා ඇත. සෙසු අයගේ දත්වල කුහර ඇත් වීම් ඇත. බුදුරජාණන් වහන්සේගේ එසේ නොවේ.

### සුසුක්ක දාඨෝ

මෙනමින් හැඳින්වෙන්නේ උඩු හණුවේ සහ යටිහණුවේ ඇති සතර දන්තයෝ ය. බුදුරජාණන් වහන්සේගේ මේ සතර දළදවෝ මනා කොට පිහිටි අතර, ඉතා සුදු ය. සිනාසෙන කල ඒවායින් සුදු රැස් විහිදේ .

### පහූත ජිව්හෝ

බුදුරදුන්ගේ ජිව්හාව දිගින් ද, පළලින් ද, මෘදු බවින් ද, සම ද වර්ණවත් වේ. එසේ හෙයින් කටහඬ මිහිරි ය. අසන්නන් ප්‍රබෝධමත් කරයි. ධර්මචක්‍ර සූත්‍ර දේශනාව වැනි හරබර දේශනාවන් අකණිටා බ්‍රහ්ම ලෝක දක්වා ඇසෙන පරිදි දේශනා කිරීමට දිව මහත් සේ රුකුල් විය.

### බ්‍රහ්මස්සරො හෝති කරවිකභාණී

අන්‍යයන්ගේ කටහඬට වඩා තථාගතයාණන් වහන්සේගේ කටහඬ ඉතා සියුම් වූවෙකි. ස්වරය බ්‍රහ්මස්වර ලෙස හැඳින්වේ. පහසුවෙන් තේරුම් ගත හැකි ය. කුරුවිකෙවිල්ලන්ගේ නාදය සේ හඳුන්වනු ලබන්නේ කටහඬේ ඇති මිහිරියාව නිසාවෙනි.

### අභිනීල නෙත්තෝ

තථාගත බුදුරජාණන් වහන්සේගේ නේත්‍රා යුග්මය ඉතා මනහර වූවෙකි. නේත්‍රාවේ මධ්‍යම මණ්ඩලය දිය බෙරලිය මල් සෙයින් තිල් පැහැ ගතියි. රන්වන් පාට ඇත්තේ ය. රතු, කළු ආදි ඒ ඒ තැන්වල මනා කොට පිහිටීමෙන් කාන්තිය උපදවන්නේ ය. මෛත්‍රිය , කරුණාව, දයාව වැනි ගුණාංගවල දී කරුණා ඇසින් ලෝක සත්වයා දෙස බැලූහ.

### ගොපමඛෝ

අන්‍යයන්ගේ ඇස් මෙන් නොව තථාගතයාණන් වහන්සේගේ නේත්‍රා යුග්මය අලුතෙන් උපන් රතු වස්සකුගේ ඇස් මෙන් ප්‍රසන්නය. ඔප දැමූ මැණික් ගුලි දෙකක් මෙන් සිනිඳු මෙන් ම පැහැපත් ය.

### උණ්ණාභමුක්කන්තරේ ජාති

බුදුරජාණන් වහන්සේගේ දෙබැම අතර මැද දක්ෂිණාවර්තව ශුභ්‍රවර්ණ රෝමයක් පිහිටා ඇත. ඊට ඌර්ණ රෝම ධාතුව ලෙස නම් කෙරේ.

### උණ්හීස සීසෝ හෝති


විශේෂ මාංස පටලයකින් තථාගත බුදුරජාණන් වහන්සේගේ නළලෙහි ඇත්තේ ය. එය උණ්හීස යන නමින් හැඳින්වේ.

මේ ආදි වූ මහා පුරිස ලක්ෂණ තිස් දෙකක් කෙනකුට නො පිහිටන්නේ ය. එසේ පිහිටා තිබුණේ නම් ඒ සක්විති රජකෙනකුට ම වන්නේ ය. ඔවුන් විසින් එම ලක්ෂණ පදනම් කරගෙන සතර මහාද්වීපයම තම පාලනයට නතු කර ගන්නේ ය.

බලබෝව,
කනිෂ්ඨ විද්‍යාලයේ
නියෝජ්‍ය විදුහල්පති ශාස්ත්‍රපති
**කන්දේකුඹුරේ නන්දසාර හිමි**

# රෑ වැටුණු වළේ දවල් වැටෙන්නේ ඇයි?





දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

## ගෝධ ජාතක කතාව

**නැති ගුණ ඇති බව පෙන්වා පසුව පාපී ක්‍රියාවල නිරත වී තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇතැම් පුද්ගලයෝ පුරුදු වී සිටිති. නායකත්වය, ජාතික හැඟීම, ආගමික ලැදියාව, සීල ගුණය පෙන්වීම, බොහෝ විනය ගරුකවීම, උගත්කම පෙන්වීම, තනතුරු ප්‍රදර්ශනය කිරීම, වචන භාවිතය, මිල අධික වාහන පරිහරණය, අධික වටිනාකම්වලින් යුක්ත ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල් සහ ආභරණ පරිහරණය වැනි ක්‍රියාවලින් තමන්ගේ වත්පොහොසත්කම හෝ සීල ගුණය හෝ බලය හෝ තනතුරු නාමය හෝ ප්‍රදර්ශනය කර අභිමත අවශ්‍යතා සපුරා ගැනීමට සමාජයේ විවිධ පිරිස් ඉදිරිපත් වෙති.**

එයින් සිදු වන්නේ අවංක, කාරුණික සහ දැහැමි පුද්ගලයින් මුළාවට පත්වීම සහ වංචනිකයින්ගේ ගොදුරක් බවට පත්වීම ය. මේ හේතුවෙන් සත්‍ය ගරුක පුද්ගලයින් තෝරා ගැනීමට අපහසු ය. බොහෝ පුද්ගලයින් රෑ වැටුණ වළේ ම දවල් ද වැටෙන්නේ එම නිසා ය.

ඇතැම් විට දේශපාලනයට පිවිසෙන පුද්ගලයින්ට දේශපාලන දැනුමක් නොමැත. සිල්වත් බව පෙන්වන පුද්ගලයාට ඇතැම් විට සීලයක් නැත. ධනය තිබේ යැයි පවසන්නාට ධනයක් නැත. තනතුරු හෝ බලය හිමි බව පෙන්වන්නාට එවැනි බලයක් හෝ තනතුරක් නැත. සමස්ත සමාජයම මුළා කිරීමට මෙවැනි පිරිස්වලට හැකියාව ඇති බව බුදුරජාණන් වහන්සේ ගෝධ ජාතකයේදී දේශනා කළහ.

සමාජයේ ජීවත්වීමේ දී විමසිලිමත් වීම සහ බුද්ධිමත් වීම අවශ්‍යතම අංග බව පෙන්වා දුන්හ.

කොහොන් තපස් හෙවත් බොරු සිල් සමාදන් ව ලාභාපේක්ෂාවෙන් කටයුතු කළ භික්ෂුවක් අරභයා ගෝධ ජාතක කථාව දේශනා කර ඇත. කථා පුවත මෙසේ ය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනකු රාජ්‍ය කරන සමයෙහි අපගේ බෝධිසත්වයන් වහන්සේ ගෝධ කුලයෙහි ගොයකු වී ඉපදුණා. ගොයා තම මව්පියන් සමඟ කුඩා අවධිය ක්‍රමයෙන් ගෙවා දමා හුදකලාව ජීවත්වීම තෝරා ගත්තා. ඔහුට ජීවත්වීමට විශාල තුඹසක් උපකාර වුණා. ඒ සමීපයේ ගල් ලෙනක සිල්ගත් එක් තාපසයෙක් තවුස් දම් පුරමින් ජීවත් වුණා. ගොයාත් පින් රැස් කර ගැනීමේ අදහසින් සැමදිනකම තාපසයා සමීපයට ගොස් නමස්කාර කර හිතේ සතුටින් තම වාසභවනට පැමිණ ජීවත් වෙන්න පටන් ගත්තා.

තවුස්තුමාට අවශ්‍ය ආහාරපාන අසල පිහිටි ගමේ දායකයින් විසින් ලැබීමට සලස්වා තිබුණා. දිනක් තාපසතුමාට ඉතා රසවත් මාංශ ආහාරයක් වළඳන්නට ලැබී රස තෘෂ්ණාවෙන් ඔහු පෙළී ගියා.

දෙවැනිදින දායකයින් පැමිණි පසු ඊයේ කවර මාංශයක් රැගෙන ආවේ දැයි විමසා සිටියා. එවිට උපාසකයින් කියන්නේ "පින්වත් තාපසතුමණි, අපහට ඊයේදින අහම්බෙන් ගෝධ මාංශයක් ලැබී එය රසවත් ව උයා ඔබවහන්සේ වෙත පිළිගැන්වූයෙමි"යි පවසා සිටියා. තාපසතුමා ඔවුන් වෙත කිසිවක් නො කියා "මා දකින්ට හැමදාම එන්නා වූ ගොයා කෙනෙක් ඇත. ඌ මරා රසවත් මාංශ ව්‍යඤ්ජනයක් සකසා සිත් සේ අනුභව කරමි"යි සිතා උපාසකවරුන් අමතා මෙසේ කියන්න පටන් ගත්තා.

"පින්වත් උපාසකයිනි, ඔබ සැමට සැමදාම මෙසේ පැමිණීමට නොහැකියි, ඇතැම් විට අධික වර්ෂා දිනවල පීඩා විඳිමින් මෙහි පැමිණෙති, එය මාහට සිත් නොදෙන්නේ ය. එබැවින් ලෙනෙහි ම කිසියම් ආහාරයක් පිස ගැනීමට අවශ්‍ය කළමනාකරණ ටිකක් සපයා තබන්නේ නම් ඉතාම උචිතය"යි

පවසමින් හාල්, ලුණු මිරිස් සහ අවශ්‍යම දෑ සිහිපත් කර සිටියා. උපාසකවරුනුත් ඉතාම ශ්‍රද්ධාවෙන් "අනේ එහෙනම් අපි ඔබ වහන්සේගේ අවශ්‍යතා හෙට සපුරා දෙන්නෙමු" යැයි පවසමින් පිටත් වී ගොස් පසුදින අවශ්‍ය' සියලු ද්‍රව්‍ය ලැබීමට සැලැස්සුවා.

තාපසයා ගෝධ මාංශ රසයෙන්වෙළී ගොස් තමන් වන්දනා කිරීමට එන ගොයා මරා උගේ මාංශ අනුභව කිරීමට අවශ්‍ය කටයුතු සියල්ල සූදානම් කර ගත්තා. වෙනදා මෙන් භාවනාවට පිවිසෙන ගල් ආසනයට පැන නැඟී තාපසයා වස්ත්‍රය යටින් නො පෙනෙන සේ පොල්ලක් තබාගෙන ගොයා එන තෙක් මඟ බලමින් කාලය ගත කළා. ගොයාත් සුපුරුදු ලෙසම ශ්‍රද්ධාවෙන් තාපසයා වැඳ යාමට පැමිණෙන්නේ තාපසයාගේ සිරුරෙන් පිට වෙන ගෝධ මාංශ ගන්ධයෙන් තවුසා ගෝධ මාංශ අනුභව කර ඇති බව දැන ගත්තා.

තවදුරටත් තාපසයා සමීපයට ළංවන විට ඔහුගේ මුහුණ අහංකාරයෙන්, බියෙන් සහ නපුරු අදහස්වලින් යුක්ත බව දැනගත්තා. සියල්ල වටහාගත් ඔහු වහාම එතැනින් පිටවීමට පටන් ගත්තා.

තාපසයා තමන් සමීපයට නො පැමිණ නැවතත් පිටවී යන ගොයා දැක වහා සඟවා තිබූ පොල්ල ගෙන දමා ගැසුවා. ගොයා එයින් මිදී වහා තුඹසට පිවිසියා. එය දුටු තාපසයා

"අපරාදේ මගේ අතින් ඌ ගැලවී ගියා"යි තමාට ම ඇසෙන සේ කියා ගත්තා. එය අසා සිටි ගොයා වෙනත් තුඹස් කටකින් හිස එළියට දමා "තෝ අතින් මා ගැලවුණා පමණක් ම ය. එහෙත් තෝ සතර අපායෙන් නො ගැලවුණ බව සිහි කරව"යි කියා නැවතත් මෙහෙම කියන්න පටන් ගත්තා.

"එම්බල තාපසය, තෝ තාපස වස්ත්‍රයෙන් සැරසී, අඳුන්දිවිසම් පොරවාගෙන, ජටාවෙන් සැරසී කරන කටයුතු කවරේද? තාපස වස්ත්‍රයටත්, අඳුන්දිවිසම් සහ ජටාවටත් අවැඩක්ම කළේ යැ"යි කියමින් ඔහුගේ වංචනික ක්‍රියාව හෙළා දුටුවා.

එවිට තාපසයා කියන්නේ "පින්වත් ගොයාණෙනි, ඔබ බුද්ධිමත් ය, විමසුම් නුවණකින් යුක්ත ය. මට ඔබගේ මාංශවලින් කම් නැත. මා මේ ලෙන අතහැර යන්නේ ය, ඉතින් ලෙනෙහි තිබෙන හාල්, ලුණු මිරිස් ආදි අවශ්‍ය කළමනාකරණ ද්‍රව්‍ය සියල්ල දැන් ප්‍රයෝජනයක් නැත්තේ ය., ඔබ ඒවා ගෙනගොස් භුක්ති විඳින්න"යැයි කියමින් ඔහු ගෙන්වා ගැනීමට නැවතත් උත්සාහ ගත්තා.

"තාපසයාගේ කපටිකමට අසුවුණු මම රෑ වැටුණු වළේ නැවතත් දවල් ද නො වැටෙමි"යැයි පවසමින් ගොයා තාපසයා අමතා මෙසේ පැවසුවා. "තාපසයාණෙනි, මේ තුඹස සියක් රියනක් ගැඹුර ඇත්තේ ය, තෝ අද පටන් මෙතැන නැවතත් රැඳුණොත් තොපගේ පහත් වූ ද, පාපී වූ ද, නපුරු ගතිය මෙහි පැමිණෙන උපාසකයින්ට දන්වන්නෙමි. එවිට තොපගේ කටයුතු සියල්ල නිමා වන්නේය"යි කියමින් තාපසයා බිය ගන්වා එතැනින් එළවා දැමීමට කටයුතු කළා. පින්වත් මහණෙනි, එකල කුට තාපසයා වූයේ මෙකල මේ භික්ෂුව ය. ගෝධ ව උපන්නේ බුදු වූ මම්ම වේදැයි දක්වා ජාතක කථාව අවසන් කළා.

# සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉතා ඉහළ තැනකට ගෙන ආවා

**උදාර පැවිදි දිවියක පියසටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ නිට්ටඹුව දඹදෙණිය සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යා පීඨාධිපති**

**කෝරළතුන හා පහළ බුලත්ගම දෙපළාතේ ප්‍රධාන සංඝනායක හෝකන්දර බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොටගම වාචිස්සර ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**



**සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වැනි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කොට රටට දායාද කරන ආයතනයක බහුශ්‍රැත ව්‍යක්ත ප්‍රතිබලසම්පන්න පීඨාධිපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් ලෙස ජාතික, අධ්‍යාපනික, ශාසනික වශයෙන් පුළුල් සේවාවක් සිදුකරන බව ප්‍රකටයි. ඔබ වහන්සේගේ ඒ සමාජ ක්‍රියාවලිය සාර්ථක ව සිදුකිරීමට ගුරු හාමුදුරුවන් වහන්සේලාගෙන් ලැබුණු ආභාසය මොනවගේ ද ? අපේ හාමුදුරුවනේ.**

රත්නායක මුදියන්සේලාගේ ලොකු බණ්ඩාර තිලමේ උපාසකතුමා සහ දසනායක මුදියන්සේලාගේ සෝමාවතී මැණිකේ මහෝපාසිකා මාතාව යන දෙපළ සඳාදරණීය මව්පියන් කොට 1960 වර්ෂයේ සැප්තැම්බර් 17 වෙනිදින කෑගල්ල දිස්ත්‍රික්කයේ බොහොම සුන්දර ගමක් වන රඹුක්කන කොටගම ග්‍රාමයේ ජන්ම ලාභය ලැබුවා. ඒ වගේම සහෝදර සහෝදරියන් දෙළොස් දෙනකු සිටි බවත් සිහිපත් කළ යුතුයි. රඹුක්කන මුවපිටිය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපන කටයුතු සිදු කළා.

එවකට විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකු වූ කොටගම වාචිස්සර නායක හිමිපාණන් වහන්සේ මගේ පියාගේ බාල සහෝදරයකු වශයෙන් ඥාති සම්බන්ධතාවයක් තිබුණා. උන්වහන්සේගේ පැවිදි ජීවිතයේ උත්තරීතරත්වය දැකීමත්, ඒ පැවිදි රුව කෙරෙහි මගේ සිත ඇලුම් කිරීමත් නිසා පැවිදිවීමට මගේ සිතේ තිබුණ ආසාව තවත් වැඩි වුණා. උන්වහන්සේ වැඩසිටි කාලයේ පැවිදිවීමට නොහැකි වුණත්, 1973 වර්ෂයේ ඔක්තෝබර් 01 වෙනිදා පොල්ගහවෙල දෙනගමුව බෝධිගුප්ත පිරිවෙන් පරිවේණාධිපති ව වැඩ සිටි පාරඹේ රේවත නායක හාමුදුරුවන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන්, අපවත් වී වදාළ රාජකීය පණ්ඩිත අලවතුරේ ධම්මකිත්ති නායක හාමුදුරුවන් වහන්සේගේ හා එවකට රත්මලාන පිරිවෙන් ගුරු විද්‍යාලයේ විදුහල්පති ව වැඩ සිටි යටියන්තොට නන්දාරාමාධිති බොස්සැල්ලේ ධම්මාවාස නායක හාමුදුරුවන් වහන්සේ යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් උත්තරීතර ප්‍රව්‍රජ්‍යාභාවයට පත් වුණා.

පොල්ගහවෙල දෙනගමුව බෝධිගුප්ත පිරිවෙනේ එවකට වැඩසිටි නායක හාමුදුරුවන් වහන්සේ යටතේ මූලික පිරිවෙන් අධ්‍යාපනයත්, එවකට පරිවේණාධිපති ව වැඩ සිටි ආචාර්ය මැදගොඩ සුමනතිස්ස නායක හාමුදුරුවන් වහන්සේ යටතේ පැපිළියාන සුනේත්‍රා මහාදේවී පිරිවෙනින් උසස් අධ්‍යාපනයත් ලබා ගත්තා.

1981 වර්ෂයේදී උසස් පෙළ කලා අංශයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ප්‍රථමස්ථානය ලබාගෙන 1982 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. එම කාලයේ දී ම විසි වයස් සම්පූර්ණවීමත් සමඟ මල්වතු මහා විහාරයේ දී ගුරු හාමුදුරුවන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් වාහලනාග ගෞරව නාමයෙන් යුක්තව උතුම් වූ අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගැනීමට පුණ්‍යවන්ත වුණා. 1986 වර්ෂයේදී දෙවන පෙළ ඉහළ සමාර්ථයක් සහිතව විශේෂවේදී උපාධිය ලබාගැනීමත් සමඟ කැස්බෑව ශ්‍රී නන්දන පිරිවෙන ආරම්භ කරමින් ප්‍රථම ගුරු පත්වීම ලබා ගත්තා. 1987 වර්ෂයේ මුල් භාගයේදී නුගේගොඩ සුභද්‍රාරාම පිරිවනේ ගුරුවරයකු වශයෙන්, 1988 වර්ෂය වන විට යටියන්තොට සිරිවර්ධන මහා විද්‍යාලයේ රජයේ පාසල් ගුරුවරයකු වශයෙන් සේවය කරමින් සිට වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා කොළඹට වැඩම කළා. එම වකවානුවේ දී කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය හැදෑරුවා.

පසුව කොළඹ ඉසිපතන විද්‍යාලයේ ගුරුවරයකු ලෙස සේවය කළත් ඉන් සමුගෙන 1989 වර්ෂය වන විට නිට්ටඹුව සාරිපුත්ත අධ්‍යාපන විද්‍යාපීඨයට සහකාර කථිකාචාර්යවරයකු වශයෙන් පත්වීම් ලබා ගත්තා.1991 වර්ෂයේ දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලබා ගැනීමට කටයුතු කළා. අනතුරුව ක්‍රමයෙන්, කථිකාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වශයෙන් සේවය කළ කාලවකවානුවේ දී උසස් අධ්‍යාපන කටයුතු සඳහා 1995 වර්ෂයේ දී ප්‍රංශයේ සෝබෝන් විශ්ව විද්‍යාලයට වැඩම කරනු ලැබුවත් දෙමළ ත්‍රස්තවාදී කලබල පැවැති කාල පරිච්ඡේදයක් නිසාම අඛණ්ඩව අධ්‍යයන කටයුතු කරගෙන යාමට අපහසු වුණා. එම නිසා වසරක කාලයක් ප්‍රංශ භාෂාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමට පමණක් කටයුතු කළා. නැවතත් විද්‍යාපීඨයේ උප පීඨාධිපති, පීඨාධිපති වශයෙන් දීර්ඝ කාලයක් සේවය කරමින්, දඹදෙණිය අධ්‍යාපන විද්‍යාපීඨයත් නිට්ටඹුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයත් යන පීඨ දෙකේම පීඨාධිපති වශයෙන් වසර 10 ක් සේවය කළා වගේම සම්පූර්ණ වශයෙන් වසර 34 ක කාලයක් සේවය කරමින් 2020 වර්ෂයේ විශ්‍රාම ලබා ගත්තා. ඒ වගේම පිරිවෙන් ගුරුවරයකු වශයෙන් කටයුතු කළ අවධියේ සිටම විභාග උප පරීක්ෂක, ප්‍රධාන පරීක්ෂක, පාලක පරීක්ෂක වශයෙන් වසර ගණනාවක් කටයුතු කළ බවත් සිහිපත් කළ යුතුයි.

**ඔබ වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවය වගේම විදේශීය ධර්මදූත කටයුතු සිදු වූ ආකාරයත් සිහිපත් කරනවා නම්,**

බුදු දහම හා බෞද්ධ දර්ශනයට අනුකූල වන පරිදි ජාතික පුවත්පත් වගේම බෞද්ධ පුවත්පත් සඟරා ආදියට දීර්ඝ කාලීනව විශාල වශයෙන් ශාස්ත්‍රීය ලිපි සම්පාදනය කළා. ස්වාමීන් වහන්සේලාගේ අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහයන් වගේම සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ශාස්ත්‍රීය සංග්‍රහය ආදී වශයෙන් ශාස්ත්‍රීය ලේඛන විශාල ප්‍රමාණයක් සංස්කරණය කළා. ධර්ම ශාස්ත්‍රීය, අධ්‍යාපනික, ආගමික, ශාසනික සේවය වෙනුවෙන් මල්වතු මහා විහාරයේ මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සංඝ සභාව විසින් කෝරළ තුන හා පහළ බුලත්ගම දෙපළාතේ ප්‍රධාන සංඝ නායක ධූරය පිරිනැමීමට කටයුතු කළා..

මගේ ගුරු හාමුදුරුවන් වහන්සේ නමක් වුණ පැරිස් බෞද්ධ විහාරාධිපති කොන්ගස්දෙණියේ ආනන්ද නායක හාමුදුරුවන් වහන්සේගේ ආශිර්වාදය යටතේ ප්‍රංශයේ ධර්ම ප්‍රචාරක කටයුතු සිදුකළා. ඒ වගේම අමෙරිකාව, නවසීලන්තය, සියලුම යුරෝපා රටවල ධර්මදූත සේවය සිදු කළා වගේම සෑම වසරකම ප්‍රංශයේ ධර්ම දූත සේවය සඳහා වැඩම කරනු ලබනවා.

**විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් අත්දැකීම් සම්භාරයක් ලබා ඇති ඔබ වහන්සේගේ එම අත්දැකීම් අනුව ඉදිරි ශාසනික අභිවෘද්ධිය පිළිබඳ දරන මතය සඳහන් කරමින් සාකච්ජාව අවසන් කරමු හාමුදුරුවනේ.**

තරුණ භික්ෂූන් වහන්සේලාගේ භික්ෂු ආකල්පත්, ගුරුවරයකු වශයෙන් තිබිය යුතු ආකල්ප සමුදායත් ,ගුරු භූමිකාවට අයත් කුසලතා ආදියත් සංවර්ධනය කරමින් වසර 34 ක කාලයක් සාරිපුත්ත ජාතික අධ්‍යාපන පීඨයේ ගුරුවරයකු වශයෙන් ලබාදුන් දායකත්වයට අනුව ඉතා පුළුල් අත්දැකීම් සම්භාරයක් ලබා තිබෙනවා. විවිධ ප්‍රදේශ, විවිධ විහාරස්ථාන, විවිධ පිරිවෙන් තුළින් අධ්‍යාපනය ලබාගත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පිරිසක් තමයි ආයතනයට ඇතුළත් වෙන්නේ.

තරුණ භික්ෂූන් වහන්සේලාගේ සිත් අවබෝධ කරගෙන , ගැටලු තේරුම් ගෙන ඒවාට විසඳුම් ලබා දෙමින් උන්වහන්සේලාට කාරුණිකව ආමන්ත්‍රණය කරමින් කටයුතු කිරීම බොහොම සංකීර්ණ කාර්යයක්. උන් වහන්සේලා අවබෝධකොට ගෙන කිසිදු ගැටුමක් ඇතිනොවන ආකාරයෙන් කටයුතු කිරීමට හැකි වුණා. ඒ පිළිබඳව ඉතා උසස් ලෙස දායකත්වය ලබාදුන් ගිහි පැවිදි කථිකාචාර්ය මණ්ඩලයක් සේවය කිරීමත් ඉතා පහසුවක් වුණා.

ඉතිරි කොටස 10 පිටුවේ ...

හේමමාලා රන්දුනු

# දීඝාභය කුමාරයාට විජිතපුර බලකොටුවේ තනතුරක්

**පසුදා උදෑසනින් ම පිබිදුණු සිරිනාග පළමුව සිය මව්පියන් සිහියට නැගුවේ ය. අනතුරුව නිවස ඉදිරිපිට වූ බුදුගෙට ගොස් තෙරුවන් වැඳ මව්පියන්ට පින් දුන්නේ ය. සේවකයන් විසින් සාදා දුන් උදෑසන ආහාරය ගෙන ආලින්දයට පැමිණෙන විට හසුන් පතක් රැගෙන පැමිණි දුතයකු දුටුවේ ය.**

"සෙනෙවිතුමනි ඔබතුමාට හසුන්පතක්"

"කාගෙන්ද"

"සේනාධිපතිතුමාගෙන් "

හසුන්පත භාරදුන් දූතයා පිටව ගියේ ය.

සිරිනාග හසුන්පත අතට ගෙන කියවූවේ ය.

එය හදිසි පණිවිඩයකි.

"මහමෙව්නාවේ යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට හැකි ඉක්මනින් පැමිණෙන්න. ප්‍රධාන නිලධාරීන්ට පමණක් සීමා වූ මෙම රහස් සම්මන්ත්‍රණය සඳහා මහරජතුමා ද පැමිණ සිටී.ඔබට විශේෂ ආරාධනයක්"

දීඝජන්තු මහසේනාධිපති ඇයි මේ හදිසි සම්මන්ත්‍රණයක් පවත්වන්නේ ? විශේෂ හේතුවක් නිසා විය හැකියි. මාගමට දන්වන්නට සෑහෙන යමක් දැනගන්නට හැකිවේවි. හිතූ ඔහු ජවාධික අශ්වයකු පිට නැඟී මහමෙව්නාව දෙසට ගමන් කළේ ය.

සම්මන්ත්‍රණ ශාලාව අභියස දී ඔහු පිළිගත් ආරක්ෂක භටයෙක් අසු භාරගත්තේ ය.

"සම්මන්ත්‍රණය පටන් ගත්තා. ඉදිරිපෙළ අසුනක් ඔබතුමාට වෙන්කර තිබෙනවා." සේවකයෙක් මඟ පෙන්වීය.

සම්මන්ත්‍රණ ශාලාව විවිධ නිලතල හොබවන සෙනෙවිවරුන්ගෙන් පිරී තිබිණි. සිරිනාග ඉදිරිපෙළ අසුන වෙත ගමන් කළේ ය. රජතුමාගේ දකුණු පසින් අසුන්ගෙන සිටි පුද්ගලයා දැකීමෙන් සිරිනාග මවිතයට පත්විය.

දීඝාභය කුමාරයා අද එළාර රජතුමා ආසන්නයේ ම අසුන්ගෙන. තමන්ගේ ජාතිද්‍රෝහී කුමන්ත්‍රණයේ ප්‍රතිඵලය කොතරම් හානිකරදැයි මහත් පසුතැවීමක් සිරිනාගට ඇතිවිය. මොහොතක් දීඝාභය කුමරු දෙස බලා සිටියේ ය. කුමරුගේ බැල්ම තමන් වෙත යොමු වී ඇති බව දැක ඉවත බලා ගත්තේ ය. කුමරුට තමන් හඳුනා ගැනීමට අපහසු වූ බව සිරිනාගගේ හැඟීම විය. තමා විසින් සිදු කළ හානිදායක පෙරළිය වෙනස් කරන්නේ කෙසේදැයි දස අතේ කල්පනා කළේ ය.

එළාර මහ රජතුමා ජයග්‍රාහී ලීලාවෙන් මහත් සතුටකින් අසුන්ගෙන සිටින අයුරු කාගේත් ප්‍රසාදයට හේතු විය. මිත්‍ර, දීඝජන්තු සෙනෙවිවරුන්ගේ විලාසය ද ප්‍රබෝධමත් විය.

දීඝජන්තු සභාව අමතමින් සිටියේ ය. අද මේ විශේෂ සම්මන්ත්‍රණය පැවැත්වීමට හේතු දෙකක් තිබෙනවා. අද පස්වරුවේ යුද සම්මන්ත්‍රණය පැවැත්වීමට නියමිත ව තිබියදී පෙරවරුවේ මෙම සම්මන්ත්‍රණය පැවැත්වූයේ විශේෂ තනතුරු ප්‍රදානය කිරීමක් සඳහායි. "

"එළාර මහ රජතුමාගේ ළඟින්ම අසුන්ගෙන සිටින්නේ කාවන්තිස්ස රජතුමාගේ පුත්‍රයකු වන දීඝාභය කුමාරයා යි. දුටුගැමුණු කුමාරයා තම පියාට එරෙහිව කටයුතු කළ නිසා කළකිරී අපගේ රාජධානියට පක්ෂපාත වී පැමිණ සිටිනවා. මහවැලි දකුණු ගං තීරයේ තොටමුණු තිහක ආරක්ෂක කඳවුරු සියල්ල අපට පවරා දෙමින් අපේ අනාගත ජයග්‍රහණය තහවුරු කිරීමට එතුමා කටයුතු කර තිබෙනවා. දීඝාභය කුමාරයාට මහා සෙනෙවි තනතුරක් පවරමින් විජිතපුර බලකොටුවේ පාලන සේනාංකය භාරදීමට මහරජතුමාගේ කැමැත්ත ලැබී තිබෙනවා."

සභාවේ පිරිස මහත් අත්පොළසන් නාදයකින් එය අනුමත කළේ ය. එමෙන්ම ඉදිරිපෙළ අසුනේ මාගේ අසුනට දකුණු පසින් අසුන් ගෙන සිටින්නේ සිරිනාග උප සෙනෙවිතුමායි. අපේ චරපුරුෂ සේවයේ සුවිශේෂී මෙහෙවරක් කළ ඔහුට සෙනෙවි තනතුරක් දී අගනුවරට ආරක්ෂක ප්‍රධානියා ලෙස පත් කිරීමට රජතුමා තීරණය කර තිබෙනවා. "

සභාව අත්පොළසන් දෙමින් එය අනුමත කළේ ය.

අනතුරුව නව පත්වීම් ලැබූ විජිතපුර බලකොටුවේ ප්‍රධාන ආරක්ෂක නිලධාරි දීඝාභය මහා සෙනෙවිතුමාට සභාව ඇමතීමට ආරාධනා කෙරිණි.

දීඝාභය කුමාරා නැඟී සිටියේ ය. ඔහුගේ පෞරුෂය ප්‍රසන්න ය. නමුත් ඔහු එතරම් ප්‍රබෝධයකින් පසු නොවන බව ඔහුට හැඟී ගියේ ය. තමන් කිසියම් උගුලකට හසුවී ඇතැයි ඔහුට අවබෝධ වූවහොත් එය කෙතරම් අගනා සිතිවිල්ලක්දැයි සිරිනාග සිතුවේ ය.

මහරජතුමනි, මහා සේනාධිපතිවරුනි, සෙන්පතිවරුනි, මාගම රාජධානියේ පුත් කුමරුවකු ලෙස ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ මම එයින් මිදී මෙහි පැමිණියේ දුටුගැමුණු විරෝධියෙක් ලෙසයි. පිය රජතුමාට මම මගේ ජීවිතයටත් වඩා ආදරය කරනවා. ගැමුණු මාගේ සහෝදරයකු වූවත් ඔහු පියාට කළ අපහාසය නිසා මට ඔහු පිළිකුල් වුණා. ගිරි රාජධානියේ අපගේ මාමණ්ඩිය වූ ගිරි අබා රජතුමා සහ නැන්දණිය ගිරි නුවරින් පන්නා දැමීමට කටයුතු කළා. ගිරි රාජධානිය අරාජික වූ විට එහි රජු ලෙස පත් කිරීමට පිය රජු යෝජනා කළේ මගේ නමයි. නමුත් ගැමුණු කුමාරයා ඔහුගේ පුරෝහිත දාව බ්‍රාහ්මණයා එම තනතුරට පත්කළා. ඔහු පියරජතුමාගේ අවසරයක් පවා නොගෙනයි එම පත්වීම සිදුකර තිබුණේ. මේ ද්‍රෝහිකම්වලට ඔහුට දඬුවම් ලබා දිය යුතුයි. අනුරාධපුර රාජධානියේ දුටුගැමුණු කුමාරයාගේ ආක්‍රමණ වැළැක්වීමට මම මගේ උපරිම දායකත්වය ලබා දෙනවා. ඒ සඳහා මට ප්‍රබල සේනාංකයක් පැවරීම ගැන මම රජතුමාට ස්තුතිවන්ත වෙනවා. එම කාර්යය මට හැකි උපරිම අයුරින් සාර්ථක ව ඉටුකරන බවට සැමට පොරොන්දු වෙනවා."

ඉන්පසුව සිරිනාගට සභාව ඇමතීමට ආරාධනා ලැබිණි.

"මහරජතුමනි, දීඝාභය කුමාරයාණෙනි, මහා සෙනෙවිවරුනි ප්‍රභුවරුනි,"

මහරජතුමා ප්‍රමුඛ ඔබ සැමට මගේ ස්තුතිය පිරිනමනවා. මට පිරිනැමුණු අලුත් තනතුර පිළිබඳව. මගේ සේවය සාර්ථක ව ඉටු කිරීමට මා පොරොන්දු වෙනවා. අනුරාධපුරයේ චරපුරුෂ සේවයේ යෙදීමට මට පැවරුණු විශේෂ කාර්යයකි. නමුත් දීඝාභය කුමාරයා අපට පක්ෂපාත වීමත් සමගම එම කාර්යය නිමාවට පත්වෙනවා. "

"උතුරු ප්‍රදේශයේ අපේ දේශසීමා පුළුල් කරන්නට අපට තිබුණු ලොකුම බාධාව දීඝාභය කුමාරයායි . දැන් සටන් නොකරම අපි රුහුණේ උතුරු සීමාව පුළුල් කරගෙන තිබෙනවා. "

"ඒ වගේම මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා විශේෂ යුධ පුහුණුවක් සඳහා මා සොළී රටට යැවූ මිත්‍ර සෙනෙවිතුමාට. එහිදී මා තවත් වාසියක් ලබා ගත්තා. මාස කිහිපයක් මා එහි යුද පුහුණු කඳවුරු භාරව සිටියා. ඒ කාලය තුළදී මාහට යුද රහස් දැන ගන්නට හැකිවුණා. ඒ සියල්ල දැනටමත් මා රජතුමාට වාර්තා කර තිබෙනවා".

**අයන්ති විතාන**

---

*සාරිපුත්ත ජාතික අධ්‍යාපන ...*

*09 පිටුවෙන්*

එම වාතාවරණයත් සමඟ සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉතා ඉහළ ස්ථානයකට රැගෙන ඒමට හැකි වුණ බව අධ්‍යාපන අමාත්‍යාංශය වගේම සමස්ත සමාජයම දන්නා කරුණක්.

අප අධ්‍යාපනය ලබාගත් අවධිය බොහොම දුෂ්කර කාලයක් බවත් සිහිපත් කළ යුතුයි. පොතපත , පෑන් පැන්සල් සොයා ගැනීමත් අපහසුයි. වර්තමානයේ මෙන් පහසුකම් නොමැති වුවත්, ඉතා හොඳින් වෙහෙස මහන්සිවෙලා අධ්‍යාපනය ලැබුවා. මව්පියන්ගෙන් ලබා තිබුණු ආභාසයට, ශික්ෂණයට අනුව උත්සාහවත්ව ගුරු හාමුදුරුවන් වහන්සේලාගෙන් ලබාගත හැකි සියලු දැනුම් සම්භාරයන් ලබාගෙන ගුරු ගෞරවයෙන් යුක්තව ඉතාම දුෂ්කර කාලයක දී වුවත් උනන්දුවෙන්, කැපවීමෙන්, සාර්ථකව අධ්‍යාපන කටයුතු සිදු කළා. අපේ තරුණ ස්වාමීන් වහන්සේලා ආදර්ශවත්ව වගකීමෙන් යුතුව පැහැදුන අයගේ පැහැදීම වැඩිවීමටත්, අපැහැදුන අයගේ පැහැදීම ඇතිවන ආකාරයටත් කටයුතු කළ යුතුයි.

---

# ඒකක නිපාතය

අංගුත්තර නිකායෙන් 15

## සූත්‍ර අංක - 56 -අකුසලභාගියා සූත්‍රය

මහණෙනි, යම් ධර්ම කෙනෙක් අකුසල් වෙත් ද, අකුසල් භජනයෙහි, අකුසල් පක්ෂයෙහි වැටෙත් ද ඒ හැම ධර්මයෝ සිත පෙරටු කොට ඇත. සිත ඒ ධර්මයන්ට පළමු කොට උපදී. ඒ හා එක්විට ම අකුසල ධර්මයෝ උපදිත්.

අටුවාව – පළමුව සිත ඉපදී පසුව චෛතසිකයෝ උපදී යැයි නො ගත යුතු ය. එක්වම උපදී. එක්වම නිරුද්ධ වේ. යම් සේ රජු නික්මුණේ යැයි කියන ලද කල්හි සෙසු රාජ සේනාව නික්මුණේ ද නොනික්මුණේ දැයි විමසිය යුතු කරුණක් නොවේ. සියලු සේනාව නික්මුණේ යැයි අදහස් වේ.

## සූත්‍ර අංකය - 57 - කුසලභාගියා සූත්‍රය

මහණෙනි, යම්කිසි ධර්ම කෙනෙක් කුසල ධර්මයෝ වෙත් ද, කුසල භජනයෙහි, කුසල පක්ෂයෙහි වැටෙත් ද ඒ සියලු ධර්මයෝ සිත පෙරටු කොට ඇත. සිත ඒ ධර්මයන්ට පළමුව උපදනේ ය. ඒ හා එක්වීම ම කුසල ධර්මයෝ ද උපදිත්.

## සූත්‍ර අංකය - 58 - පමාද සූත්‍රය (සිහිමුළාව)

මහණෙනි, යම් කරුණක් හේතු කොට ගෙන නූපන්නා වූ අකුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ කුසල ධර්මයෝ පිරිහෙත් නම් ප්‍රමාදය (සිහිමුලාව) වැනි අන් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, ප්‍රමාද වූ පුද්ගලයා තුළ (පෙර) නූපන් අකුසල ධර්මයෝ උපදිත්, උපන්නා වූ කුසල ධර්මයෝ වෙත් ද පිරිහෙත්.

අටුවාව – මෙහි ප්‍රමාදය (සිහිමුළාව) කවරේද? කාය හෝ වචී හෝ මනෝ හෝ දුශ්චරිතයන්හිද, පඤ්චකාම ගුණයන්හිද හැසිරීමට සිතට ඉඩදීමය. තවද කුසල ධර්මයන්ගේ වැඩීමට ඉඩ නොදීමය.

**සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තන මණ්ඩලයේ ලේකම්**
**කේ.කේ.සුගතපාල**





නාමල්ගමුවේ විජයසීල ස්වාමීන්වහන්සේ දහම් දෙසමින්

# අප වෙනුවෙන් ඩුබායිහි පැවැත්වූ වෙසක් සතිය

**ලක්වාසීන්ට මෙවර ද වෙසක් උත්සවය සැමරීමට වාසනාවක් ලැබුණේ නැත. ඒ පසුගිය වසරේ මෙන්ම මේ වසරේ ද වෙසක් උලෙළ කොවිඩ් 19 වසංගතය විසින් ගිල ගනු ලැබීම නිසා ය. එම නිසා නිවසේ සිට වෙසක් සැමරීමට අපට සිදු විය.**

එසේ වුවත් ශ්‍රී ලංකාවාසීන් ඇතුළු සමස්ත ලෝකවාසීන්ටම ආශීර්වාද සහ සෙත් සුව ප්‍රාර්ථනා කිරීමේ අරමුණින් ඩුබායි සහ උතුරු එමීරයත්හි ශ්‍රී ලංකා කොන්සල් ජෙනරල් නලින්ද විජේරත්න මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ඩුබායි ලංකාරාමය සහ එක්සත් අරාබි එමීර්රාජ්‍යයේ සියලුම ශ්‍රී ලාංකික සංවිධාන එක්ව සංවිධානය කළ "ඩුබායි වෙසක් සතිය 2021 " මහත් ආගමික ශ්‍රද්ධාවකින් යුතුව පවත්වන ලදී. ඒ මැයි මස 24 සිට 29 දින දක්වා ඩුබායි කොන්සල් ජෙනරාල් කාර්යාල පරිශ්‍රයේදී ය.

ශ්‍රී ලංකාව තුළ වෙසක් සති පැවැත්වෙන ආකාරයෙන්ම මේ වෙසක් සතිය පැවැත්වූ අතර වෙසක් සතිය තුළ බොදු ගී, බෞද්ධ වෙසක් නාට්‍ය ඉදිරිපත් කිරීමට ද කොන්සල් ජෙනරාල් කාර්ය මණ්ඩලය සහ ඩුබායි සහ උතුරු එමීරයත්හි ශ්‍රී ලාංකික සංවිධාන විසින් කටයුතු කර තිබුණි.

විශේෂයෙන්ම බොදු ගී සරණිය පවත්වන ලද්දේ මෙරට බොදු ගී පවත්වන අයුරින්ම වන අතර බෞද්ධ තේමා කිහිපයක් ඔස්සේ රඟ දැක්වූ නාට්‍යයද සියලු දෙනාගේ සිත් ඇද ගන්නට සමත් විය.

බෞද්ධයන්ගේ කරුණාව, දයාව, මෛත්‍රිය ඔප් නැංවෙන අයුරින් මේ සියලු කටයුතු සිදු කර තිබුණි.

වෙසක් සතියේ ප්‍රධානම අංගයක් ලෙස වෙසක් පුන් පොහෝ දින "සත් බුදු වන්දනා" පූජාවක් ඩුබායි ලංකාරාම වාසී නාමල්ගමුවේ විජයසීල ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පැවැත්විණි.

එමෙන්ම විශාල පිරිසක් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව සීල භාවනා සමාදාන වැඩසටහනකට ද ඉදිරිපත් විය.

මෙම වෙසක් සතිය වැඩ සටහනට සමගාමීව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා සුබ සාධක සංගමය (සහන) සහ කොන්සල් ජෙනරාල් කාර්යාලය එක්ව සංවිධානය කළ ලේ දන්දීමේ වැඩ සටහන ද සතිය පුරාම ඩුබායි ලතීෆා රෝහලේදී පැවැත්වුණි. එමෙන්ම ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සිහි ගන්වමින් දන්සලක් මඟින් දිවා ආහාර ලබාදීමක් ද සිදු කරන ලදී. කොවිඩ් වසංගතය නිසා පූර්ණ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව මේ කටයුතු සියල්ල සිදු කෙරුණි.

පැහැදිලිව ම පෙන්වා දෙන්නේ නම් මෙරට ජනතාව වෙනුවෙන් මැද පෙරදිග බෞද්ධ උරුමයක් සොයා ගැනීම පවා උගහට සමාජයක සිදු කරන ලද මේ සත්කාර්යය අප බෙහෙවින් අගය කළ යුතු ය.

වෙසක් සැරසිලි වලින් අලංකරණය කර තිබූ මේ වෙසක් සතියේ බෞද්ධ කොඩි මෙන්ම වෙසක් පහන් කූඩු පෙන්නුම් කෙළේ මෙරට බෞද්ධ උරුමයේ උද්දීපනයයි.

වෙසක් සතිය තුළ සිදු කළ මේ සියලුම වැඩ සටහන් කොන්සල් ජෙනරාල් කාර්යාලයේ නිල සමාජ මාධ්‍ය හරහා විකාශය කිරීම ද සිදු කෙරිණි.

තාරක වික්‍රමසේකර




බොදු ගී ගායනය

04 පිටුවෙන්

## ශාසන ඉතිහාසය ...

බුදුරදුන්ගේ ශාරීරික ධාතූන් වහන්සේ අතුරින් ලලාට ධාතූන් වහන්සේ පිළිබඳ විස්තර විවරණ ඇතුළත් වන්නේ ලලාට ධාතු වංශයේ ය. බුදුරදුන්ගේ ශාරීරික ධාතු වහන්සේ පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් වංශකථාව ධාතුවංශයයි. එමඟින් ලංකා ඉතිහාසය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වේ.

ලක්දිව පාලනය කළ දැහැමි පාලකයකු වූ සිරිසඟබෝ රජුගේ හිස දන් දීමේ පුවත මූලික කරගත් අත්තනගලු විහාරය ආශ්‍රිත ඓතිහාසික තොරතුරු ඇතුළත් වංශකථාව හත්ථවනගල්ල විහාර වංශයයි.

ඉහතින් සඳහන් කළ සියලුම වංශකථා අනුරාධපුර යුගයේ සිට යුග කීපයක් තුළ සම්පාදනය වී ඇති හෙයින් ලංකාවේ ශාසන ඉතිහාසය පිළිබඳ බොහෝ තොරතුරු ඒවායේ අන්තර්ගත ව තිබේ. එබැවින් ඒ සියල්ල ලංකා සම්බුද්ධ ශාසනයේ ඉතිහාසය මෙන්ම සිංහල ජාතියේ ඉතිහාසය හැදෑරීමේ දී බෙහෙවින් අත්‍යවශ්‍ය මූලාශ්‍ර වේ.

එසේම සිංහල බෞද්ධ සංස්කෘතිය හා සම්බන්ධ පුදපූජා වත්පිළිවෙත් පෙරහර ආදී සංස්කෘතිකාංග සියල්ල නිර්මාණය වීමෙහිලා අවශ්‍ය පදනම සැකසී තිබෙන්නේ යථෝක්ත වංශකථා ආශ්‍රයෙන් ය. ආරම්භයේදී පාලියෙන් රචනා වී තිබූ මෙම වංශකථා සාහිත්‍ය සිංහල භාෂාවට පරිවර්තනය වීම නිසා ඒ සියල්ල මෙරට සිංහල බෞද්ධ ජනතාව අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත්ව තිබේ.

පාලියෙන් පැවති අවදියේ උගතුන්ට පමණක් සීමා වූ තොරතුරු සිංහලට පරිවර්තනය වීම හේතුවෙන් පොදු ජනයාගේ සිත්ගත් සාමාන්‍ය දැනුමක් බවට පත්ව ඇති අතර එයින් පොදුජන ආගමික චින්තනය පෝෂණය වී තිබේ. මේ අනුව ජාතියේ හා ආගමේ ඉතිහාසය වාර්තා කරන වංශකථාවලට බෞද්ධ සාහිත්‍ය තුළ විශේෂ තැනක් හිමිව තිබේ.



# මව් සෙනෙහසට පුද දුන් දාගැබ
# ඓතිහාසික යුදගනාව ස්තූපය

මව් සෙනෙහසේ උණුහුමට මනුසතුන් සේ ම වනසතුන් ද එකසේ ලැදිය. මව්කිරි බිඳක වටිනාකම ගෙවීමට අපට මේ භවය ප්‍රමාණවත් නොමැති අතර මව් සෙනෙහස වෙනුවෙන් දස දහස් ගී පබැඳුණේ ඒ නිසාවෙනි.

ආදරයේ නාමයෙන් ටජ් මහල් බැඳුණු බව ලොවපුරා ප්‍රචලිත වුව ද උත්තරීතර මව් සෙනෙහස වෙනුවෙන් ස්තූප බැඳුණු බව ඔබ නොදන්නවා ඇත.

ලක්දිව ස්තූප නිර්මාණයේ ඉතිහාසය සොයාබලන විට අශෝක අධිරාජ්‍යයාගේ කාලයේ දී ලක්දිවට බුදුදහම පැමිණීමත් සමඟ දෙවන පෑ තිස් රජුගේ අනුග්‍රාහකත්වයෙන් ඉදිවුණු මෙරට පළමු දාගැබ ලෙස ථූපාරාමය හඳුනාගත හැකි ය.

එහෙත් ථූපාරාමයට පෙර ඉදිකරන ලද ස්තූප දෙකක් පිළිබඳව වංශකථා තොරතුරු දක්වා ඇත. බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනයේ දී සමන්තකූටවාසි මහා සුමන නම් දෙවිඳුන් විසින් බුදුන් වහන්සේගේ කේශධාතු තැන්පත් කොට මහියංගන ස්තූපය ඉදිකර ඇත.

එසේම බුදුන් වහන්සේට පළමු දානය පූජා කළ තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් මෙරට නැඟෙනහිර වෙරළේ තිරියාය ප්‍රදේශයේ බුදුන් වහන්සේගෙන් ලබා ගත් කේශධාතු තැන්පත් කර ගිරිහඬු සෑය ඉදිකර තිබේ. මහියංගනය හා ගිරිහඬු සෑය එලෙස ලක්දිව ඉදිකළ පළමු ස්තූප වශයෙන් වංශකතා පෙන්වා දෙයි. නමුත් එය පුරාවිද්‍යාත්මක ව සනාථවී නැත.

ආගමික අවශ්‍යතාවය මූලික කරගෙන බිහිවූ ස්තූප කලාව පසුකාලීන ව පෞද්ගලික ස්මරණයන් සඳහා ද යොදා ගන්නා ආකාරය ඉතිහාසය තුළින් හඳුනාගත හැකි ය. එවන් ස්මරණ ස්තූපයකි යුදගනාව දාගැබ. එහි සුවිශේෂත්වය වන්නේ එය තම ආදරණීය මව වෙනුවෙන් පුතකු විසින් ඉදිකරන ලද ස්තූපයක් වීමයි.

මෙම මව්ගුණ සෑයේ නිර්මාතෘවරයා වූයේ පුලතිසිපුර රජ කළ මහා පරාක්‍රමබාහු රජු ය.

මහා විජයබාහු රජුගෙන්(ක්‍රි.ව.1055-1110) පසුව ලක්දිව කොටස් කිහිපයකට බෙදී යන අතර එහිදී දක්ඛිණ දේශයේ පාලකයා වූයේ මහා විජයබාහු රජුගේ මිත්තා නම් සහෝදරියගේ එක් පුත්‍රයකු වූ මානාභරණ කුමාරයා ය. ඔහු දක්ඛණ දේශයේ පුංඛ ග්‍රාමයේ (වර්තමාන දැදිගම) මූලික කරගෙන පාලනය ගෙනගිය අතර ඔහුගේ බිරිය වූයේ මහා විජයබාහු රජුගේ තිලෝක සුන්දරී නම් බිසවට උපන් රත්නාවලී කුමරියයි. ඔවුන් දෙපළට දියණියන් තිදෙනෙක් වූ අතර පසුව රාජ්‍යය පාලනයට උරුමකම් කීමට කුමරුවෙක් ද උපදිණි. ඔහු පරාක්‍රමබාහු නම් විය.

කිත්සිරිමේඝ රජුගේ ඇවෑමෙන් රජකමට පත්වූ පරාක්‍රමබාහු කුමරු දක්ඛණ දේශයේ සිට මුළු ලක්දිවම එක්සේසත් කිරීමට කටයුතු කරන්නට විය. දැඩි අභියෝග රැසකට මුහුණපාමින් මහත් වූ ප්‍රයත්නයකින් පසුව ක්‍රි.ව. 1153 දී රජරට බලය අත්පත් කරගන්නා පරාක්‍රමබාහු රජු ක්‍රි.ව. 1161දී දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ ද තමන් භාරයට ගෙන පූර්ණ රාජ පාලකයෙක් ලෙස මෙරට අභිෂේක විය.

මෙසේ රාජප්‍රාප්ත මහා පරාක්‍රමබාහු රජු ඉදිකළ ස්තූප අතරින් පුරාණ රුහුණු රටේ ඉදිකළ රත්නාවලී සෑය වර්තමානයේ යුදගනාව සෑය ලෙස හැඳින්වේ.

මෙම ස්තූපය එතුමා තම මව වූ රත්නාවලී කුමරිය ආදාහනය කළ ස්ථානයේ ඇය ස්මරණය කරනු පිණිස නිර්මාණය කරන ලද්දේ යැයි ජනප්‍රවාදයේ පවතී.

මේ පිළිබඳව පවතින තවත් ජනප්‍රවාදයක් වන්නේ තම මවගේ හා කඩොල් ඇතුගේ භාරකාරත්වය වෙනුවෙන් දුටුගැමුණු කුමරු හා සද්ධාතිස්ස කුමරු අතර සටනක් ඇතිවූ බවත් පසුකාලීනව ඒ පිළිබඳව කම්පාවට පත් සද්ධාතිස්ස කුමරු එම යුධ භූමිය ආශ්‍රිතව ස්ථූපයක් කළ බවයි. චූලාංගනී විහාරය නමින් අයත් ඉදිකිරීම් සංකීර්ණයක් ද මේ ආසන්නයේ ඇති අතර ජනප්‍රවාදයේ පවතින්නේ එම ගොඩනැඟිලි සංකීර්ණය පිහිටුවා ඇත්තේ දුටුගැමුණු සද්ධාතිස්ස යන සොහොයුරන් සටන් වැදුණු ස්ථානය මුල්කරගෙන බවයි. ඒ අනුව යුදගනාව දාගැබ හෙවත් පුරාණ රත්නාවලී සෑය පරාක්‍රමබාහු රජු විසින් තම මව වෙනුවෙන් ඉදිකළා යැයි සඳහන් මතය පිළිගැනීමට සිදුවේ.

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යුදගනාව ග්‍රාම නිලධාරී වසමේ යුධගනාව ස්ථූපය පිහිටා තිබේ. උතුරින් පුහුලුගල කඳුවැටිය ද, නැඟෙනහිරින් මැණික් ගඟ ද, දකුණින් බුත්තල නගරය ද, බටහිරින් යුදගනාව වැවට ද මධ්‍යගත ව පිහිටි මෙම ස්තූපයේ වර්තමාන උස මීටර් 26ක් වන අතර වටප්‍රමාණය අඩි 1038 අඟල් 6කි. මෙම ස්තූපය නිර්මාණයේ දි පේසාව මත ගර්භයෙන් අඩක් නිමවා ඒ මත වූ සමතලා බිමෙහි කුඩා ස්තූපයක් ගොඩනංවා තිබූ බවට සාධක ඇත.

මෙම දාගැබ හැඩය සම්බන්ධයෙන් විද්වතුන් අතර පවතින එක් මතයක් වන්නේ මෙය කොටවෙහෙර සම්ප්‍රදායේ ස්තූපයක් බවයි. ඒ මතයට අනුව කොටවෙහෙර සම්ප්‍රදායේ ස්තූපයන්හි කොත්කැරැල්ලක් නොමැත. නමුත් ස්තූප නිර්මාණ තාක්ෂණය පිළිබඳ උපදෙස් සපයා ඇති කිසිදු ඓතිහාසික ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයක එවැනි සම්ප්‍රදායක් හෝ හැඩයක් පිළිබඳව සඳහන් වී නොමැත.

ඒ අනුව එම මතය විවාදයට තුඩුදේ. නමුත් මෙරටින් එම හැඩයෙන් යුතු තවත් ස්තූප ගණනාවක් (ලාහුගල කොටවෙහෙර, දැලිවල කොටවෙහෙර) හමුවීම තුළ මෙය නව ආකෘතියක අත්හදා බැලීමක් ද නැතහොත් ස්තූප නිර්මාණය අතරමඟ ඇණහිටීමක් ද යන්න විමසා බැලිය යුතු වේ. කොටවෙහෙර සම්ප්‍රදායක් පිළිබඳ ප්‍රබල කථිකාවක් ගොඩනොනඟන විද්වතුන් ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථවල සඳහන් හැඩයන් පමණක් මෙරට ශේෂවී ඇති නටබුන් ස්තූපයන්ගෙන් දැකීමට උත්සාහ ගැනීම නිසා මෙම ස්තූපයේ විශේෂත්වය ද මඟහැරී ඇති බව පෙනේ.

වනගතව පැවැති මෙම ස්තූපය පිළිබදව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වන්නේ 1979 වර්ෂයේ දී වන අතර ඒ අනුව වනය හෙළි පෙහෙළි කර මතු කර ගන්නා මෙම ස්තූපය අද වනවිට වන්දනාමාන කිරීමේ යෝග්‍ය වටපිටාවක් තුළ දැකගත හැකි ය. ස්තූපය ආසන්නයේ මහනුවර යුගයේ දී වරිච්චි බිත්තියෙන් ඉදිකරන ලද ප්‍රතිමා ගෘහයක් ඇති අතර එම ගෘහය ඇතුළත හා පිටත චිත්‍ර දැකගත හැකි ය.

මෙම ස්ථානයට නුදුරින් කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ කාලයට අයත් එතුමා විසින් කරවන ලද "ගව්ව" නමින් ප්‍රකට දුර ප්‍රමාණයන් දැක්වූ ශිලා ස්ථම්භයක් දක්නට ඇත. බෝධිඝරයක, පිළිමගෙයක හා ටැම්පිට පිළිම ගෙයකට සමාන ඉදිකිරීමක් මෙම විහාර භූමියේ දක්නට ලැබෙන අතර, නටබුන් ව පැවැති කුඩා දාගැබක් 1992 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කර තිබේ.

මේ ආසන්නයේ ඇති යුදගනාව වැව ඓතිහාසික ව සනාථවන කරුණු අනුව මහානාග රජතුමා විසින් ඉදිකර ඇත.

මුළු ලක්දිවම එක්සේසත් කළ, සාගර බඳු මහා වැව් බැඳ සහලින් රට ස්වයංපෝෂිත කළ, පර රාජ්‍යයන් පවා ආක්‍රමණය කළ මහා පරාක්‍රමබාහු රජු තම ආදරණීය මවගේ ගුණ සිහිපත් කරනු පිණිස ඇය ආදාහනය කළ ස්ථානයේ පුරාණ රුහුණු රට වූ විශාලතම ස්තූපය ඉදිකිරීම තම මව්පියන් වැඩිහිටි නිවාස වෙත පිටුවහල් කරන අජාසත්ත පරපුරේ නූතන දරුවන්ට මනා ආදර්ශයකි.



කේ.උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව